# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත

---

[සහතිකය සටහන් කළේ 1990 ජූනි මස 01 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1990 ජූනි මස 01 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක.

මිල: රු. 3.60 යි. තැපැල් ගාස්තුව : රු. 3.10 යි.

# 1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත

[සහතිකය සටහන් කළේ 1990 ජූනි මස 01 වන දින]

එල්. ඩී.—ඕ. 46/87

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා ද, තෘතීයික අධ්‍යාපනයේ හා වෘත්තීය අධ්‍යාපනයේ සංවර්ධනය සඳහා සැලසුම් ඇතිකිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා ද, ජාතික කාර්මික හා ආධුනිකත්ව පුහුණු කිරීම් අධිකාරියක් පිහිටුවීම සඳහා ද ඒවාට සම්බන්ධ හා ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලසීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මෙම පනත 1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

## I වන කොටස

## I වන පරිච්ඡේදය

### තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිහිටුවීම

**2.** (මෙහි මින් මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) තෘතීයික අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යනුවෙන් හඳුන්වනු ලබන කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබිය යුතුය. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිහිටුවීම.

**3.** (1) (අ) ආර්ථිකයේ මිනිස් සම්පත් අවශ්‍යතාවලට සරිලන අයුරින් සියලුම මට්ටම්වල තෘතීයික අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපන ක්‍රමය සැලසුම් කිරීම, සම්බන්ධීකරණය සහ සංවර්ධනය කිරීම; කොමිෂන් සභාවේ පරමාර්ථ.

(ආ) සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ඇතුළුව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ප්‍රදානයන් පිරිනැමීම සඳහා ජාතික වශයෙන් පිළිගත් ක්‍රමයක් සංවර්ධනය කිරීම : සහ

(ඇ) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපනය සලස්වන ශිල්පායතන, නියෝජ්‍යායතන සහ වෙනත් සියලු ආයතනවල ශාස්ත්‍රීය හා පුහුණුවීම් සම්මතයක් පවත්වාගෙන යාම

කොමිෂන් සභාවේ පොදු පරමාර්ථ විය යුතු ය.

(2) තෘතීයික අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපනය සංවර්ධනයෙහිදී කොමිෂන් සභාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27 වන ව්‍යවස්ථාවේ (2) වන ඡේදයේ (ඍ) අනුඡේදයේ දක්වා ඇති විධාන ප්‍රතිපත්ති මගින් මාර්ගෝපදේශකත්වය ලැබිය යුතු ය.

**4.** (අ) තෘතීයික අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපනයට අදාළ පොදු ප්‍රතිපත්තිය ගැන අමාත්‍යවරයාට උපදෙස් දීමට; කොමිෂන් සභාවේ බලතල.

(ආ) තෘතීයික අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපනය සම්බන්ධ පොදු ප්‍රතිපත්තිය බලගැන්වීම ගැන සහතික කිරීමට;

(ඇ) තෘතීයික අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන ක්‍රමය සම්බන්ධීකරණය කිරීමට ;

(ඈ) මේ පනතේ මේ කොටස යටතේ ලියාපදිංචි කළ ශිල්පායතනවල මුදල්, කාර්ය මණ්ඩල හා අතිකුත් අවශ්‍යතාවන් ගැන අමාත්‍යවරයාට වාර්තා ඉදිරිපත් කිරීමට;

(ඉ) අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව මේ පනතේ මේ කොටස යටතේ ලියාපදිංචි කරන ලද ආයතනවලට සංවර්ධන සැලැස්මකින් බලයදී ඇති යම් කාර්යයක් වෙනුවෙන් ශිල්පායතනවලට, නෛපුණ්‍ය හා ආයතනවලට ප්‍රදානයන් සහ පිහිටාධාර කිරීමට, හා ගෙවීමට ;

(ඊ) මේ පනතේ මේ කොටස යටතේ ලියාපදිංචි කළ සියලු ශිල්පායතනවල හා ආයතනවල ශිෂ්‍යයන්ගේ හා කාර්ය මණ්ඩලයේ සුභසාධනය සහතික කිරීම පිණිස අවශ්‍ය පහසුකම් තීරණය කිරීමට ;

(උ) අවශ්‍ය විය හැකි රීති සෑදීමට ; සහ

(ඌ) කොමිෂන් සභාවේ පරමාර්ථ මුදුන්පත් කරගැනීම පිණිස අවශ්‍යවේ යයි හෝ හිතකර යයි හෝ ආනුෂංගිකයයි කොමිෂන් සභාවේ මතය වන වෙනත් සියලු ක්‍රියා කිරීමට

කොමිෂන් සභාවට බලය තිබිය යුතු ය.

අමාත්‍යවරයා විසින් කරනු ලබන සාමාන්‍ය විධාන.

5. (1) තෘතීයික අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපනයේ සාමාන්‍ය මෙහෙයවීම පිළිබඳවත් මේ පනත පරිපාලනය කිරීම පිළිබඳවත් අමාත්‍යවරයා වගකිව යුතු ය.

(2) තෘතීයික අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳව සහ මේ පනත පරිපාලනය පිළිබඳව සිය වගකීම් සාර්ථක ලෙස ඉටුකිරීමට ඔහුට හැකිවනු පිණිස, ජාතික ප්‍රතිපත්තියට අනුකූලවනසේ අමාත්‍යවරයා විසින් කලින් කල කොමිෂන් සභාව වෙත සාමාන්‍ය ලිඛිත විධාන නිකුත් කරනු ලැබිය හැකි ය :

එසේ වුවද, මේ පනතේ 20 වන හා 26 වන වගන්ති යටතේ වූ කොමිෂන් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීමට අදාළව, අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවට එවැනි යම් විධානයක් නිකුත් නොකළ යුතු ය.

(3) කොමිෂන් සභාවේ කර්තව්‍ය හා කාර්යවලට අදාළව තමා විසින් අවශ්‍යයයි සලකනු ලබන තොරතුරු සපයන ලෙස අමාත්‍යවරයා විසින් කලින් කල කොමිෂන් සභාවට නියම කරනු ලැබිය හැකි ය.

(4) කොමිෂන් සභාව විසින් එවැනි විධාන ඉටු කළ යුතු අතර කොමිෂන් සභාවට ඒ විධාන ඉටුකිරීමට හැකිවනු පිණිස අවශ්‍ය විය හැකි, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපනය සලස්වන සෑම ශිල්පායතනයකම, නියෝජ්‍යායතනයක සහ වෙනත් ආයතනයක පාලන අධිකාරිය විසින්ම කොමිෂන් සභාවට එවැනි පහසුකම් සැලැස්වීම හෝ එවැනි තොරතුරු සපයාදීම හෝ කළ යුතු ය.

කොමිෂන් සභාවේ සංයුතිය.

6. (1) කොමිෂන් සභාව පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) තෘතීයික අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(ආ) ජාතික ආධුනිකත්ව හා කාර්මික අභ්‍යාස ආයතනයේ සභාපතිවරයා ;

(ඇ) 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතනය පනතින් පිහිටුවන ලද ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(ඈ) උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ කාර්මික අධ්‍යාපන අධ්‍යක්ෂවරයා ; සහ

(ඉ) කර්මාන්ත, වාණිජ්‍යය හෝ අධ්‍යාපනය පිළිබඳ ක්ෂේත්‍රයෙහි පළපුරුද්ද ඇත්තාවූ තැනැත්තන් අතුරින්, අමාත්‍යවරයා විමසා ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන (මෙහි මින්මතු "පත් කරන ලද සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) හතරදෙනකුට නොඅඩු සහ හය දෙනකුට නොවැඩි තැනැත්තන් සංඛ්‍යාවක්.

(2) යම් තැනැත්තකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභාවක මන්ත්‍රීවරයකු වේ නම් හෝ විය හැකි නම් ඔහු කොමිෂන් සභාවේ පත් කරන ලද සාමාජිකයකු වීමට නුසුදුස්සකු විය යුතුය.

(3) ජනාධිපතිවරයා විසින් අමාත්‍යවරයා විමසා කොමිෂන් සභාවේ පත් කරන ලද සාමාජිකයන්ගෙන් එක් අයකු (මෙහි මින් මතු "සභාපතිවරයා" යයි සඳහන් කරනු ලබන) කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත් කළ යුතු ය.

(4) 7 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, කොමිෂන් සභාවේ සෑම පත් කරන ලද සාමාජිකයෙක් ම, ඔහු එම ධූරයට පත් කරන ලද දිනයේ සිට අවුරුදු හතරක කාලයකට ධූර දැරිය යුතු ය.

ධූරය අත්හැරීම.

7. (1) අමාත්‍යවරයා විමසා ජනාධිපතිවරයා විසින් ලියවිල්ලකින් පත් කරනු ලබන නියමයකින් කිසිම හේතුවක් නොදක්වා පත් කරන ලද සාමාජිකයකු ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර, ඉක්බිති ඒ සාමාජිකයා ධූරය අත්හැරියා සේ සලකනු ලැබිය යුතු ය.

(2) පත් කරන ලද සාමාජිකයකුට, අමාත්‍යවරයා වෙත තත් කාර්ය සඳහා යොමු කරන ලද ලිපියක් මගින් සිය ධූරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එවැනි ඉල්ලා අස්වීමක් අමාත්‍යවරයා විසින් පිළිගැනීමෙන් පසු ක්‍රියාත්මක විය යුතු ය.

(3) මියයෑම, ඉල්ලා අස්වීම හෝ යම් පත් කරන ලද සාමාජිකයකු ඉවත් කිරීම නිසා ධූරය හිස් කරන ලද අවස්ථාවක දී, 6 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ විධිවිධානවලට අනුකූලව, ජනාධිපතිවරයා විසින් ඒ සාමාජිකයා අනුප්‍රාප්ත කිරීම පිණිස වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකිය. එසේ පත් කරන ලද යම් තැනැත්තකු විසින් ඔහුගේ පූර්වගාමියාගේ ධූර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය තුළ ධූරය දැරිය යුතු ය.

කොමිෂන් සභාවේ රැස්වීම්.

8. (1) කොමිෂන් සභාවේ සෑම රැස්වීමකම මූලසුන සභාපතිවරයා විසින් දැරිය යුතු ය. යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විටක, පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතුරෙන් එක් සාමාජිකයකු ඒ රැස්වීමේ මූලාසනය දැරීම පිණිස තෝරා පත්කරගනු ලැබිය යුතුය.

(2) යම් රැස්වීමක ගණපූරණය කොමිෂන් සභාව විසින් තීරණය කළ යුතු ය.

(3) කොමිෂන් සභාවේ යම් රැස්වීමකදී තීරණ ගැනීම සඳහා ඇති සියලු ප්‍රශ්න පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්දවල සමානකමක් ඇතිවූ අවස්ථාවකදී සභාපතිවරයාට හෝ මූලසුන දරන සාමාජිකයාට තමාගේම ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(4) සභාපතිවරයා—

(i) කොමිෂන් සභාවේ රැස්වීම්වල න්‍යායපත්‍රය පිළියෙල කිරීම ගැනත් මේ පනතේ මූලධර්ම හා විධිවිධාන ක්‍රියාවේ යෙදවීමේ කාර්ය සඳහා අවශ්‍යයයි තමා විසින් සලකනු ලබන ප්‍රතිපත්ති සහ පියවර කොමිෂන් සභාව විසින් සලකා බැලීම සඳහා ඉදිරිපත් කිරීම ගැනත් වගකිව යුතුය ; තවද

(ii) කොමිෂන් සභාවේ කටයුතු පාලනය කිරීමේ කාර්ය සඳහා කොමිෂන් සභාව විසින් පවරාදුන් බලතල ක්‍රියාත්මක කළ යුතු ය.

(5) (3) වන හා (4) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, කොමිෂන් සභාව විසින් කොමිෂන් සභාවේ රැස්වීම් සහ ඒ රැස්වීම්වලදී කටයුතු කිරීම සම්බන්ධයෙන් වූ ස්වකීය කාර්ය පටිපාටිය විධිමත් කරනු ලැබිය හැකිය.

(6) කොමිෂන් සභාවේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් හෝ යම් සාමාජිකයකුගේ පත්වීම පිළිබඳ වූ යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම, කොමිෂන් සභාවේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු වූ ලෙස සලකනු නොලැබිය යුතු ය.

(7) නිවාඩු ගැනීමෙන්, රෝගාතුරවීමෙන්, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමෙන් හෝ වෙනත් හේතුවකින් තම ධුරයේ කාර්ය ඉටුකිරීමට සභාපතිවරයාට තාවකාලිකව නොහැකිවෙතොත්, සභාපතිවරයාට සිය ධුරයේ කාර්ය ඉටුකිරීමට නොහැකිවන කාලසීමාව සඳහා අමාත්‍යවරයා විසින් සාමාජිකයන්ගෙන් එක් අයකු වැඩබලන සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය හැකිය.

කමිටු.

9. (1) කොමිෂන් සභාවේ කර්තව්‍ය ඉටුකිරීමේදී ඊට සහායවීම පිණිස කොමිෂන් සභාව විසින් කමිටු පත්කරනු ලැබිය හැකිය ; එවැනි කමිටුවල සාමාජිකයන් වීම පිණිස එය විසින් සුදුසු යයි තල් පනා කරනු ලබන එවැනි යම් තැනැත්තන් පත්කරනු ලැබිය හැකිය.

(2) කොමිෂන් සභාව විසින්, (1) වන උපවගන්තිය යටතේ පිහිටුවන ලද කමිටුවකට, එය විසින් සුදුසු යයි කල්පනා කරනු ලබන එහි බලතල පවරාදෙනු ලැබිය හැකි නමුත්, කමිටුවකට එය විසින් පවරාදී ඇති යම් බලතලයක් ඉවත් කරනු නොලැබිය යුතුය. කොමිෂන් සභාවට කමිටුවක් විසින් කරනු ලැබ ඇති යම් තීරණයක් සංශෝධනය කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ කළ හැකිය.

කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ කාර්ය මණ්ඩලය.

10. (1) (අ) (මේ පනතේ ' අධ්‍යක්ෂ ජනරාල්වරයා ' යනුවෙන් සඳහන් කරනු ලබන) තෘතීයික අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්වරයා යන නාමය හා අභිධානය යටතේ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයකු ද;

(ආ) කොමිෂන් සභාවට ලේකම්වරයකු ; සහ

(ඇ) අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහායවීම පිණිස අවශ්‍යයයි සලකනු ලබන වෙනත් නිලධරයන් සහ අනිකුත් කාර්ය මණ්ඩලය ද

පත් කරනු ලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා කොමිෂන් සභාවේ කාර්යාලයේ ප්‍රධානයා විය යුතු අතර, එහි පරිපාලනය ගැන වගකිව යුතු ය.

(3) අධ්‍යක්ෂ ජනරාල්වරයා—

(අ) 14 වන වගන්තිය යටතේ ලියාපදිංචි කර ඇති අභ්‍යාසායතන වල අධීක්ෂණය ගැනත්, 15 වන වගන්තිය යටතේ ලියාපදිංචි වී ඇති නියමිත පාඨමාලා කරගෙන යනු ලබන තැනැත්තන් හා ආයතනවල අධීක්ෂණය ගැනත් වගකිව යුතු ය ;

(ආ) කොමිෂන් සභාව විසින් තමා වෙත පවරා දී ඇති බලතල හා කර්තව්‍ය ක්‍රියාත්මක කළ යුතු ය.

(4) මේ වගන්තියේ (2) වන හා (3) වන උපවගන්ති යටතේ තමා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී, ඔහුට අවශ්‍ය යයි පෙනෙන නියමයන් කිරීම පිණිස අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය ඇත්තේ ය.

(5) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කරන ලද යම් නියමයන් සංශෝධනය කිරීමට, ප්‍රතිශෝධනය කිරීමට හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීමට කොමිෂන් සභාවට බලය ඇත්තේ ය.

(6) කොමිෂන් සභාවට ලැබිය යුතු මුදල් සහ වෙනත් දේපළ සඳහා සහ ඒවා අය කරගැනීම සඳහා නඩු පැවරීම පිණිස වූ අනන්‍ය අයිතියද අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත සතු විය යුතුය ; ඒ සමගම නඩු පැවරීම සඳහා ද ගිවිසුම් සහ සමර්පණය කිරීම සඳහා සහ ඒ දේපළට අදාළව වෙනත් සියලු නිත්‍යානුකූල දේ කිරීම සඳහා බලය ද ඔහු සතු විය යුතුය. මේ වගන්තිය ප්‍රකාර අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ගෙන ඇති යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක් නතර

නොකළ යුතු අතර, ඔහුගේ මරණය, ඉල්ලා අස්වීම, විශ්‍රාම ගැනීම හෝ ධුරයෙන් ඉවත් කිරීම යන හේතු නිසා දුස්කර නොයතයුතු නමුත් ධුරයෙහි ඔහුගේ අනුප්‍රාප්තිකයා විසින් ඒ අනුප්‍රාප්තිකයාගේ නාමයෙන් දිගටම කරගෙන යා යුතු ය.

## II වන පරිච්ඡේදය

## සංවර්ධන සැලැස්ම

සංවර්ධන සැලැස්ම.

**11.** (1) කොමිෂන් සභාව විසින් කලින් කල, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව සහ සුදුසුකම් සඳහා වූ නිශ්චිත ක්‍රම හෝ ඇතුල් වීමේ අවශ්‍යතා ඇතුළුව, අමාත්‍යවරයා විසින් යම් මඟ පෙන්වීම් නිකුත් කරනු ලැබ ඇත්නම්; ඒ මඟ පෙන්වීම්වලට අනුකූලව, ශ්‍රී ලංකාවෙහි තෘතීයික අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපනය සංවර්ධනය කිරීම සඳහා අවස්ථාවෝචිත පරිදි, සැලැස්මක් හෝ සැලසුම් පිළියෙල කරනු ලැබිය යුතු ය. අමාත්‍යවරයා විසින්, ඒ සම්බන්ධයෙන් වූ තමාගේ වාර්තාව ද සමඟ ඒ එක් එක් සැලැස්ම හෝ සැලසුම් අනුමතිය සඳහා ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) අමාත්‍යවරයා විමසා, ජනාධිපතිවරයා විසින් ඒ සැලැස්ම හෝ සැලැසුම් සංශෝධන සහිතව හෝ රහිතව අනුමත කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් අනුමත කරන ලද එවැනි සෑම සැලැස්මක්ම, (මේ පනතේ "සංවර්ධන සැලැස්ම" ලෙස සඳහන් කරනු ලබන) තෘතීයික අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපනික සංවර්ධන සැලැස්මක් ලෙස අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරවනු ලැබිය යුතු ය. ඒ සියලු සංවර්ධන සැලැස්මවල් ක්‍රියාත්මක කිරීම ගැ... කොමිෂන් සභාව වගකිව යුතු ය.

(4) පළාතක ප්‍රධාන අමාත්‍යවරයකුගේ ඉල්ලීම ... ඒ පළාතේ තෘතීයික අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපනය සංවර්ධනය කිරීම සඳහා (1) වන උපවගන්තිය යටතේ සැලැස්මක් පිළියෙල කර... ලෙස අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාව... විධා... කරනු ලැබිය හැකි ය. ජනාධිපතිවරයා විසින් (2) ව... උපව...ත්තිය යටතේ තීරණයක් කිරීමට මත්තෙන්, ඒ පිළිබඳව ... අමාත්‍යවරයා විමසිය යුතු ය.

(5) සංවර්ධන සැලැස්මක් මගින් ... සම්බන්ධයෙන් යම් ප්‍රදානයක් දීම ... අමාත්‍යවරයාගේ අනුමතිය ඇතිව කොමිෂන් ... විසින් කරනු ලැබිය හැකි ය.

(6) තෘතීයික අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන හෝ තෘතීයික අධ්‍යාපන හෝ වෘත්තීය අධ්‍යාපන විධිවිධාන සහ... ප්‍රාදේශීය විද්‍යාල. කාර්මික විද්‍යාල සහ ශිල්පායතන ... යුතු ය.

(7) මේ වගන්තියේ විධිවි... පනත යටතේ පිහිටුවන ලද ... සභාව සම්බන්ධයෙන් අදාළ ...

කොමිෂන් සභාව විසින් ජාතික වශයෙන් පිළිගත් තෘතීයික අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන ප්‍රදාන ක්‍රමයක් පිළියෙල කළ යුතු බව.

12. (1) කොමිෂන් සභාව විසින්, 11 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ, යම් ලියාපදිංචි කළ විභාගයක්, තත් කාර්ය සඳහා වූ විභාගයක් ලෙස පිළිගැනීම ඇතුළුව, ජාතික වශයෙන් පිළිගත් යම් තෘතීයික අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන ප්‍රදානයන් පිළිබඳ යෝජනා ක්‍රමයක් සඳහා සැලසුම් පිළියෙල කළ යුතු ය.

(2) සංවර්ධන සැලැස්මකට, (1) වන උපවගන්තියෙහි සඳහන් ප්‍රදානයන් පිළිබඳ යෝජනා ක්‍රමයක් ඇතුළත් වූ කල්හි, ඒ ප්‍රදානයන් පිළිබඳ යෝජනා ක්‍රමය, ජාතික තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ප්‍රදාන ක්‍රමයක් ලෙස පිළිගනු ලැබිය යුතු ය.

## III වන පරිච්ඡේදය

## ලියාපදිංචි කිරීම

නියමිත පාඨමාලා තීරණය කිරීම.

13. (1) (අ) 14 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ ලියාපදිංචි කරන ලද යම් ආයතනයක් ;

(ආ) 14 වන වගන්තියේ (6) වන උපවගන්තියේ විධිවිධාන යටතේ නිදහස් කරන ලද යම් ආයතනයක් ; හෝ

(ඇ) ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

හැර යම් තැනැත්තකු හෝ ආයතනයක් විසින් පවත්වනු ලබන තෘතීයික අධ්‍යාපන පාඨමාලාවක් හෝ වෘත්තීය අධ්‍යාපන පාඨමාලාවක් නියමිත පාඨමාලාවක් ලෙස, සංවර්ධන සැලැස්මක නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ය.

(2) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින්, ඒ පාඨමාලාව මේ පනතේ 15 වන වගන්තියේ කාර්ය සඳහා නියමිත පාඨමාලාවක් ලෙස සලකනු ලැබිය යුත්තේ කවර දිනයක සිටද ඒ දිනය නියම කරනු ලැබිය හැකි ය.

ආයතන ලියාපදිංචි කිරීම.

14. (1) කිසිදු තැනැත්තකු විසින්, මේ පනත යටතේ ලියාපදිංචි කරනු නොලැබ, තෘතීයික අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපනය නැතහොත් තෘතීයික අධ්‍යාපනය හෝ වෘත්තීය අධ්‍යාපනය සැලැස්වීම සඳහා යම් ආයතනයක් පිහිටුවීම, කළමනාකරණය කිරීම, පවත්වාගෙනයාම හෝ පාලනය කිරීම නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි කිරීමේ කාර්ය සඳහා, අවස්ථාවෝචිත පරිදි, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපනය නැතහොත් තෘතීයික අධ්‍යාපනය හෝ වෘත්තීය අධ්‍යාපනය සලස්වන තැනැත්තන් සහ ආයතන වර්ග, යම් සංවර්ධන සැලැස්මක වර්ගකර දක්වනු ලැබිය හැකි ය.

(3) ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීම් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත කරනු ලැබිය හැකිය. එවැනි ඉල්ලීමක් ලැබුණු පසු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, ආයතනයේ පවත්නා පහසුකම් සහ කාර්ය මණ්ඩලයේ ප්‍රමාණවත් බව ද ඇතුළුව, ආයතනයේ යෝග්‍යතාවය පිළිබඳ වාර්තාවක් කොමිෂන් සභාවට කරනු ලැබිය යුතු ය.

(4) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කරන ලද වාර්තාව උඩ සංවර්ධන සැලැස්මට අනුකූලවන ලෙස, අවස්ථාවෝචිත පරිදි, තෘතීයික අධ්‍යාපනය සහ වෘත්තීය අධ්‍යාපනය නැතහොත් තෘතීයික අධ්‍යාපනය හෝ වෘත්තීය අධ්‍යාපනය ප්‍රමාණවත් ලෙස සැලැස්වීමට ඒ ආයතනයට පිළිවන් බවට කොමිෂන් සභාව සෑහීමට පත් වූ අවස්ථාවක, කොමිෂන් සභාව විසින් ඒ ඉල්ලීම අනුමත කළ යුතු ය. අනුමත කිරීමෙන් පසු, කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන නාමය හා අභිධානය යටතේ, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ ආයතනය ලියාපදිංචි කළ යුතුය. තවද, කොමිෂන් සභාව විසින්, ආයතනයේ පාලන අධිකාරිය නිශ්චය කිරීමද ආයතනය ලියාපදිංචි කළයුත්තේ කවර නිසි වගීයක් යටතේද ඒ නිසි වගීය නිශ්චය කිරීමද කරනු ලැබිය යුතුය.

(5) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කලින් කල, (4) වන උප වගන්තිය යටතේ ලියාපදිංචි කරන ලද ආයතනවල ලැයිස්තුවක් සහ ඒ ආයතනවලට අදාළ නියම කරනු ලබන වෙනත් විස්තර ද ගැසට් පත්‍රයේ පළ කරවීමට සැලැස්විය යුතු ය.

(6) මේ වගන්තියේ විධිවිධාන—

(i) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලවලට හා උසස් අධ්‍යාපන ආයතනවලට ;

(ii) (267 වන අධිකාරය වූ) නීති අධ්‍යාපන සභාව ආඥාපනත යටතේ පිහිටුවන ලද නීති අධ්‍යාපන සභාවට ;

(iii) 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනත මගින් පිහිටුවන ලද ජාතික අධ්‍යාපන ආයතනයට ; සහ

(iv) 1986 අංක 30 දරන අධ්‍යාපන විද්‍යාල පනතින් පිහිටුවන ලද අධ්‍යාපන විද්‍යාලවලට

අදාළ නොවිය යුතුය.

නිශ්චිත පාඨමාලා ලියාපදිංචි කිරීම.

15. (1) කිසිදු තැනැත්තකු හෝ ආයතනයක් විසින්, නිශ්චිත පාඨමාලාවක් වන, යම් තෘතීයික අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන පාඨමාලාවක් හෝ තෘතීයික අධ්‍යාපන පාඨමාලාවක් හෝ වෘත්තීය අධ්‍යාපන පාඨමාලාවක්, මේ පනත යටතේ ලියාපදිංචි කරනු නොලැබ නොපැවැත්විය යුතු ය.

(2) ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීම් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත කරනු ලැබිය යුතු ය. එවැනි ඉල්ලීමක් ලැබුණු පසු, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, තැනැත්තාගේ හෝ ආයතනයේ පවත්නා පහසුකම් හා කාර්ය මණ්ඩලයේ ප්‍රමාණවත් බව ද ඇතුළුව, තැනැත්තාගේ හෝ ආයතනයේ යෝග්‍යතාවය පිළිබඳව වාර්තාවක් කොමිෂන් සභාවට කරනු ලැබිය යුතු ය.

(3) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කරන ලද වාර්තාව උඩ, සංවර්ධන සැලැස්මට අනුකූල වන ලෙස, අවස්ථාවෝචිත පරිදි, තෘතීයික අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපනය නැතහොත් තෘතීයික අධ්‍යාපනය හෝ වෘත්තීය අධ්‍යාපනය ප්‍රමාණවත් ලෙස සැලැස්වීමට ඒ තැනැත්තාට හෝ ආයතනයට පිළිවන් බවට කොමිෂන් සභාව සෑහීමට පත්වූ අවස්ථාවක, කොමිෂන් සභාව විසින් ඒ ඉල්ලීම

අනුමත කළ යුතු ය. අනුමත කිරීමෙන් පසු, කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන නාමය හා අභිධානය යටතේ, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ නැනැත්තා හෝ ආයතනය ලියාපදිංචි කරනු ලැබිය යුතු ය. තව ද කොමිෂන් සභාව විසින්, ආයතනයේ පාලන අධිකාරිය නිශ්චය කිරීම ද ආයතනය ලියාපදිංචි කළ යුත්තේ කවර නිසි වර්ගයක් යටතේ ද ඒ නිසි වර්ගය නිශ්චය කිරීම ද කරනු ලැබිය යුතු ය.

(4) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කලින් කල, (3) වන උප වගන්තිය යටතේ ලියාපදිංචි කරන ලද නැනැත්තන්ගේ හෝ ආයතනවල ලැයිස්තුවක් සහ ඒ ආයතනවලට අදාළ, නියම කරනු ලබන වෙනත් විස්තර ද ගැසට් පත්‍රයේ පළ කරවීමට සැලැස්විය යුතු ය.

පිළිගත් විභාග ලියාපදිංචි කිරීම.

16. (1) කිසිදු නැනැත්තකු හෝ ආයතනයක් විසින්, මේ පනත යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලියාපදිංචි නොවී, යම් තෘතීයික අධ්‍යාපන ප්‍රදානයක් හෝ වෘත්තීය අධ්‍යාපන ප්‍රදානයක් පිරිනැමීම හෝ ප්‍රදානය කිරීම සඳහා කිසිදු විභාගයක් නොපැවැත්විය යුතු ය :

එසේ වුව ද, මේ වගන්තියේ විධිවිධාන—

(අ) 14 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි වී ඇති යම් ආයතනයක් සම්බන්ධයෙන් ;

(ආ) 14 වන වගන්තියේ (6) වන උපවගන්තිය යටතේ නිදහස් කරනු ලැබ ඇති යම් ආයතනයක් සම්බන්ධයෙන් ;

(ඇ) 15 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි කළ නියමිත පාඨමාලා පවත්වන යම් නැනැත්තකු හෝ ආයතනයක් සම්බන්ධයෙන් ; සහ

(ඈ) එක් තනි ආයතනයක හෝ සංවිධානයක අභ්‍යන්තර කාර්ය සඳහා එහි සේවා නියුක්තයන් හෝ අභ්‍යාසලාභීන් සඳහා පවත්වනු ලබන යම් විභාගයක් සම්බන්ධයෙන්

අදාළ නොවිය යුතු ය.

(2) මේ වගන්තියේ විධිවිධාන යටතේ ලියාපදිංචි කිරීමේ කාර්ය සඳහා සැපයිය යුතු තොරතුරු නියම කරනු ලැබිය යුතුය.

(3) ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලීම් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත කරනු ලැබිය යුතු අතර, නියම කරන ලද ක්‍රියාපටිපාටියට අනුකූල වූ සියලු ඉල්ලීම් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(4) නියම කරන ලද ක්‍රියාපටිපාටියට අනුකූල වූ සියලු ඉල්ලීම් කොමිෂන් සභාව විසින් අනුමත කළ යුතු ය. අනුමත කිරීමෙන් පසු, ඒ විභාග අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(5) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කලින් කල (4) වන උප වගන්තිය යටතේ ලියාපදිංචි කරන ලද විභාග ලැයිස්තුව ගැසට් පත්‍රයේ පළ කිරීමට සැලැස්විය යුතු ය.

14 වන හා 15 වන වගන්ති යටතේ ලියාපදිංචි කරනලද තැනැත්තන් හා ආයතන සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ බලතල.

17. (1) 14 වන වගන්තිය යටතේ ලියාපදිංචි කරන ලද යම් ආයතනයක් සම්බන්ධයෙන් සහ 15 වන වගන්තිය යටතේ ලියාපදිංචි කරන ලද යම් තැනැත්තන් සහ ආයතන සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන බලතල ක්‍රියාත්මක කළ හැකි ය :—

(අ) 14 වන වගන්තිය යටතේ ලියාපදිංචි කරන ලද යම් ආයතනයක පැවැත්විය යුතු අධ්‍යයන පාඨමාලා සහ පුහුණුව තීරණය කිරීම ;

(ආ) (i) ලියාපදිංචි කළ තැනැත්තකු හෝ ආයතනයක් විසින් පවත්වාගෙන යන එක් එක් අධ්‍යයන හෝ පාඨමාලා වලට ; හා

(ii) එක් එක් නියමිත පාඨමාලාවට, ඇතුළත්වීම සඳහා තිබිය යුතු අවශ්‍යතාවයන් තීරණය කිරීම ;

(ඇ) කාර්ය මණ්ඩලයේ සුදුසුකම් තීරණය කිරීම ;

(ඈ) (i) අධ්‍යයන පාඨමාලා සම්බන්ධයෙන් විෂය මාලාව ; සහ

(ii) අභ්‍යාස පාඨමාලා සම්බන්ධයෙන් විෂය නිර්දේශ පිළිබඳ උපදේශ නිකුත් කිරීම සහ නිශ්චිත පාඨමාලා පවත්වන ලියාපදිංචි ආයතන, තැනැත්තන් හෝ ආයතන විසින් එම උපදේශ පිළිපදිනු ලබන බවට වගබලා ගැනීම ;

(ඉ) පවත්වාගෙන යායුතු අධ්‍යාපනික සහ පුහුණුවේ සම්මතයන් තීරණය කිරීම ;

(ඊ) සහතිකපත්‍ර, විශිෂ්ටතා සහ වෙනත් ප්‍රදානයන් ප්‍රදානය කිරීම සඳහා පැවැත්විය යුතු විභාගවල ආකාරය ගැන තීරණය කිරීම ;

(උ) ශිෂ්‍යයන්ගේ හා කාර්ය මණ්ඩලයේ විධිමත් සුභසාධනය සහතික කිරීමේ ලා අවශ්‍ය පහසුකම් තීරණය කිරීම ;

(ඌ) ලියාපදිංචිකළ ආයතනවල කළමනාකරුවන්ගේ සහ ප්‍රධානයන්ගේ කාර්ය සහ ඔවුන්ගේ කාර්ය ඉටු කළ යුතු ආකාරය තීරණය කිරීම ;

(එ) විෂයමාලාව අනුමත කිරීම සහ ජාතික තෘතීයික අධ්‍යාපන ප්‍රදානයන් හා වෘත්තීය අධ්‍යාපන ප්‍රදානයන් වෙනුවෙන් වූ යම් විභාගයක් පැවැත්විය යුතු ආකාරය තීරණය කිරීම ;

(ඒ) උපදේශකයන්ගේ සුදුසුකම්, පුහුණුවීමේ කාලසීමාව, වැටුප්, පත්වීම්, ශ්‍රේණිගත කිරීම, අත්හිටවීම සහ ඉවත් කිරීම තීරණය කිරීම ;

(ඔ) ශිෂ්‍යයන් දේශනවලට සහභාගි විය යුතු දිනයන් සහ වේලාවන් ද සියලු ලියාපදිංචි කළ ආයතන විසින් නිවාඩු දින ලෙස නිරීක්ෂණය කළ යුතු දිනයන් ද නියමිත පාඨමාලා පැවැත්විය යුතු ස්ථාන ද තීරණය කිරීම ;

(ඕ) ලියාපදිංචි කළ ආයතනවල සහ නියමිත පාඨමාලා පවත්වාගෙන යන ස්ථානවල පවත්වාගෙන යායුතු ඉඩකඩ පිළිබඳ සම්මතයන් තීරණය කිරීම ; සහ

(ක) 15 වන වගන්තිය යටතේ යම් නියමිත පාඨමාලාවක් පවත්වන තැනැත්තකු විසින් දැන්වීම් ප්‍රදර්ශනය කළ යුතු ආකාරය තීරණය කිරීම.

(2) කොමිෂන් සභාවේ උපදෙස් උඩ අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මඟින්, යම් විශේෂ අධ්‍යයන හෝ පුහුණුකිරීමේ පාඨමාලාවක් වෙනුවෙන් පුහුණු කළ යුතු ශිෂ්‍ය සංඛ්‍යාව නියම කිරීම ද එසේ නිශ්චිත කිරීමට හේතු දැක්වීම ද කරනු ලැබිය හැකිය. එවැනි නියමයක් පළකිරීමෙන් පසු, ඒ නියමයේ විධිවිධානවලට අනුකූලව, කොමිෂන් සභාව විසින්, 14 වන වගන්තිය යටතේ ලියාපදිංචි කරන ලද සියලු ආයතනවලට ද 15 වන වගන්තිය යටතේ ලියාපදිංචි කරන ලද යම් තැනැත්තකු විසින් හෝ ආයතනයක් විසින් ඒ නියමිත පාඨමාලාව සඳහා ඇතුළත් කරගත යුතු ශිෂ්‍යයන්ගේ ගණන තීරණය කළ හැකිය.

18. අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ ඒ බලතල පවරා දෙනු ලැබූ අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහායවන යම් නිලධරයකුට— (මේ පනත යටතේ ලියාපදිංචි කළ තැනැත්තන් හා ආයතන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා ගේ බලතල.)

(අ) (i) ලියාපදිංචි කළ ආයතනවලින් ;

(ii) නියමිත පාඨමාලා පවත්වාගෙන යන තැනැත්තන් ගෙන් හා ආයතනවලින් ; සහ

(iii) ලියාපදිංචිකළ විභාග පවත්වාගෙන යන තැනැත්තන් ගෙන් හා ආයතනවලින්

කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන තොරතුරු, සහ වාර්තා ඉල්ලා සිටීමේ ; සහ

(ආ) ලියාපදිංචිකළ ආයතනයක හෝ තැනැත්තකුගේ යම් පරිශ්‍රයකට හෝ යම් නියමිත පාඨමාලාවක් පවත්වාගෙන යන යම් පරිශ්‍රයකට ඇතුල්වී පරීක්ෂා කිරීමේ

බලය ඇත්තේ ය.

19. 14 වන වගන්තිය හෝ 15 වන වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීම කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ යම් තැනැත්තකු විසින් ඒ තීරණය දැනුම්දීමෙන් සති දෙකක් ඇතුළත, ඒ තීරණයට විරුද්ධව අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් වෙත ලියවිල්ලකින් අභියාචනයක් කරනු ලැබිය හැකි අතර එවැනි යම් අභියාචනයක් සම්බන්ධයෙන් ඒ ලේකම්වරයා ගේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය. (ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධ අභියාචනා.)

20. (1) පහත දැක්වෙන යම් එක් හේතුවක් හෝ ඊට වැඩි හේතුන් උඩ 14 වන වගන්තිය හෝ 15 වන වගන්තිය යටතේ ප්‍රදානය කරන ලද ලියාපදිංචි කිරීමක් අවලංගු කිරීමට කොමිෂන් සභාවට බලය ඇත්තේ ය :— (ලියාපදිංචි කිරීම අවලංගු කිරීම.)

(අ) ජාතික ප්‍රතිපත්තිය උල්ලංඝණය කරමින් ක්‍රියා කිරීම ;

(ආ) සංවර්ධන සැලැස්ම කඩ කරමින් ක්‍රියා කිරීම ;

(ඈ) 17 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් පවරා ඇති යම් කොන්දේසියක් හෝ ලියාපදිංචි කිරීමේ යම් කොන්දේසියක් කඩකිරීම;

(ඇ) විනාශ අනිසි ලෙස පැවැත්වීම;

(ඉ) කොමිෂන් සභාව විසින් තත් කාර්ය සඳහා සාදා ඇති යම් රීතියක් අනුව උපදෙස් දීම සැලැස්වීමට නුපුළුවන් වීම;

(ඊ) යම් ලියාපදිංචිකළ ආයතනයක හෝ තැනැත්තකු නියමිත පාඨමාලාවක් පවත්වාගෙන යන යම් ස්ථානයක කටයුතු අයුතු ලෙස පාලනය කිරීම; සහ

(උ) තොරතුරු සැපයීම පැහැර හැරීම හෝ 18 වන වගන්තිය යටතේ පරීක්ෂා කිරීමට ඉඩ නොදීම.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති හේතුන් ගෙන් යම් හේතුවක් උඩ යම් ලියාපදිංචි කළ ආයතනයක හෝ නියමිත පාඨමාලාවක් පවත්වාගෙන යන යම් තැනැත්තකුගේ හෝ ආයතනයක ලියාපදිංචි කිරීම අවලංගු කිරීම ගැන පරීක්ෂා කොට කොමිෂන් සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස කොමිෂන් සභාව විසින් කලින් කල අධ්‍යක්ෂ ජනරාල්වරයාට විධාන කරනු ලැබිය හැකිය :

එසේ වුවද—

(i) නිවාඩු ගැනීම, රෝගාතුරවීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා අධ්‍යක්ෂ ජනරාල් වරයාට සිය කාර්ය තාවකාලිකව ඉටුකිරීමට නොහැකිවන අවස්ථාවක;

(ii) පරීක්ෂණ කිරීම් කඩිනම් කිරීම පිණිස එවැනි තැනැත්තකු පත්කිරීම අවශ්‍යවන අවස්ථාවක; හෝ

(iii) කොමිෂන් සභාවේ මතය අනුව, ඒ පරීක්ෂණය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නොපැවැත්විය යුතු අවස්ථාවක

අමාත්‍යවරයාගේ අනුමතිය ඇතිව, කොමිෂන් සභාව විසින් ඒ පරීක්ෂණය පැවැත්වීම පිණිස වෙනත් සුදුසු තැනැත්තකු පත් කළ හැකිය.

(3) අධ්‍යක්ෂවරයා විසින් හෝ පරීක්ෂණය පවත්වන වෙනත් යම් තැනැත්තකු විසින්, එය බලපාන පාර්ශ්වකරුවන් වෙත නිසි පරිදි දැනුම්දීමෙන් පසු, පරීක්ෂණයක් පවත්වා, පරීක්ෂණයේ තීරණයන් සහ නිර්දේශයන් මත වූ වාර්තාවක්, එය බලපාන පාර්ශ්වකරුවන් වෙත පිටපත් සහිතව, කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

(4) (3) වන උපවගන්තිය යටතේ වූ දැන්වීම ලැබීමෙන් පසු බලපෑම සිදුවූ පාර්ශ්වය වෙත යවන ලද දැන්වීම මගින්, කොමිෂන් සභාව විසින්, ඒ දැන්වීමේ නිශ්චිතව දක්වනු ලබන කාලයක් තුළ දී, ඔහුගේ ලියාපදිංචිකිරීම අවලංගු නොකළ යුත්තේ කුමන කරුණක් නිසාදැයි හේතු දක්වන ලෙස නියම කරනු ලැබිය යුතු අතර, නිශ්චිතව දක්වනු ලැබූ කාලය තුළ එසේ නොකරන පාර්ශ්වයේ ලියාපදිංචිකිරීම කොමිෂන් සභාව විසින් අවලංගු කළ යුතු ය.

(5) (4) වන උපවගන්තිය යටතේ දැන්වීමක් ලැබී පාර්ශ්වයක් විසින් කොමිෂන් සභාව සෑහීමකට පත්වන පරිද්දෙන් හේතු දක්වා නොමැති අවස්ථාවක, 21 වන වගන්තිය යටතේ අභියාචනාධිකරණයට කරන අභියාචනයකට යටත්ව, කොමිෂන් සභාව විසින් කරනු ලබන නියමයක් මගින්, ලියාපදිංචි කිරීම අවලංගු කරනු ලැබිය හැකි ය.

(6) (5) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක්—

(අ) අභියාචනාධිකරණයට අභියාචනයක් කළ යුත්තේ කවර කාලසීමාව ඇතුළත ද ඒ කාලසීමාව තුළ 21 වන වගන්තිය යටතේ අභියාචනයක් ඉදිරිපත් කර නැති අවස්ථාවක එකී කාලසීමාව ඉකුත්වීමෙන් පසු ද ;

(ආ) 21 වන වගන්තිය යටතේ අභියාචනයක් අභියාචනාධිකරණයට කරනු ලැබූ අවස්ථාවක අභියාචනාධිකරණය විසින් කොමිෂන් සභාවේ නියමය අනුමත කිරීමෙන් පසු ද

............

බලාත්මක විය යුතුය.

**21.** 20 වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි කිරීම අවලංගු කිරීමේ නියමයක් කිරීමෙන් සති හතරක් ඇතුළත, යම් ආයතනයක්, තැනැත්තකු හෝ ආයතනයක් විසින් යම් නීතිමය ප්‍රශ්නයක් උඩ අභියාචනාධිකරණයට අභියාචනයක් කරනු ලැබිය හැකිය ; එවැනි අභියාචනයක් කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ ආයතනයේ තැනැත්තාගේ හෝ ආයතනයේ ලියාපදිංචි කිරීම, අභියාචනය ගැන තීරණයක් කරන තුරු අත්හිටවා තිබිය යුතුය. අවලංගු කිරීමට විරුද්ධ අභියාචනා.

## IV වන පරිච්ඡේදය

### සාමාජිකත්ව උපාධි

**22.** යම් සංවර්ධන සැලැස්මක 23 වන හා 24 වන වගන්තිවල සඳහන් කරන ලද ආයතන විසින් යම් නියමිත අධ්‍යයන අංශයක සාමාජිකත්ව උපාධි ප්‍රදානය සඳහා විධිවිධාන ඇති කරනු ලැබිය හැකිය. සාමාජිකත්ව උපාධි.

උසස් අධ්‍යාපන ආයතන විසින් සාමාජිකත්ව උපාධි ප්‍රදානය කිරීම.

23. (1) වෙනත් යම් නීතියක කුමක් සඳහන් වුවද, යම් උසස් අධ්‍යාපන ආයතනයක් මගින්, සංවර්ධන සැලැස්මට අනුකූලව සහ අදාළ අමාත්‍යවරයකු සිටිනම් ඔහුගේ සහ අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, නියමිත අධ්‍යයන අංශවලින් සාමාජිකත්ව උපාධි පිරිනමනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සාමාජිකත්ව උපාධි පිරිනැමීමට බලය දෙනු ලැබූ යම් උසස් අධ්‍යාපන ආයතනයකට, 25 වන වගන්තියේ (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, පහත දැක්වෙන බලතල තිබිය යුත්තේ ය :—

(අ) සාමාජිකත්ව උපාධි ප්‍රදානය සඳහා අවශ්‍යවන විභාග සහ වෙනත් කොන්දේසි නිශ්චිතව සඳහන් කෙරෙන රීති සෑදීම ;

(ආ) සාමාජිකත්ව උපාධි ප්‍රදානය පිණිස තුඩු දෙන අධ්‍යයන පාඨමාලා පැවැත්වීමේ කාර්ය සඳහා වූ අනුබද්ධ විද්‍යාල ලියාපදිංචි කිරීම ;

(ඇ) සාමාජිකත්ව උපාධි ප්‍රදානය සඳහා අවශ්‍ය කරන තත්වයන්ට ළඟාවී ඇති, ලියාපදිංචි කළ අනුබද්ධිත විද්‍යාලවල ශිෂ්‍යයන් සහතික කරගැනීමේ කාර්ය සඳහා විභාග පැවැත්වීම ; සහ

(ඈ) අවශ්‍ය කරන විභාග සමත් වන්නාවූ සහ (අ) ඡේදය යටතේ සාදන ලද රීතිවලින් නියමිත සියලු කොන්දේසි සපුරාලන්නාවූ ශිෂ්‍යයන්හට සමාජිකත්ව උපාධි පිරිනැමීම.

සාමාජිකත්ව උපාධි ආයතන.

24. (1) සංවර්ධන සැලැස්ම අනුව, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින්, එහි නිශ්චිතව සඳහන් කරන අධ්‍යයන අංශවලින් සාමාජිකත්ව උපාධි ප්‍රදානය කිරීමේ කාර්ය සඳහා යම් ආයතනයක් සාමාජිකත්ව උපාධි ආයතනයක් ලෙස පිළිගනු ලැබිය හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ නියමයක—

(අ) ආයතනයේ නාමය සහ අභිධානය ;

(ආ) ආයතනය පිහිටි ස්ථානය ;

(ඇ) ආයතනය පිහිටුවීම සඳහා අයැදීම කරන තැනැත්තා ;

(ඈ) ඒ ආයතනය විසින් පිරිනමන හා දෙනු ලබන සාමාජිකත්ව උපාධි වර්ගය හෝ වර්ග ;

(ඉ) ආයතනයේ ව්‍යූහය

නිශ්චිතව සඳහන් කර තිබිය යුතුය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන නියමයක නිශ්චිතව සඳහන් කරනු ලබන බලතලවලට අමතරව ආයතනයකට—

(අ) ශිෂ්‍යයන් ලියාපදිංචි කිරීමට සහ නියමයේ නිශ්චිතව සඳහන් කෙරෙන අධ්‍යයන අංශවල උපදෙස්දීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ;

(ආ) ආයතනයේ පාලන අධිකාරිය සහ එහි බලතල ආයතනයේ ප්‍රධාන අධ්‍යයන හා පරිපාලන ධුරයේ අභිධානය ඔවුන්ගේ බලතල සහ කර්තව්‍ය, ආයතනයේ අධ්‍යයන මණ්ඩලය, එහි සංයුතිය සහ ඔවුන්ගේ බලතල ද සාමාජිකත්ව උපාධි ප්‍රධානය සඳහා අවශ්‍ය විභාග හා වෙනත් කොන්දේසි ද නිශ්චිතව සඳහන් කරමින් රීති සෑදීම පිණිස ;

(ඇ) නියමයේ නිශ්චිතව සඳහන් කෙරෙන අධ්‍යයන අංශවල පාඨමාලාවලින් ප්‍රවීනත්වය ලබා සිටින ශිෂ්‍යයන් තෝරා ගැනීමේ කාර්ය සඳහා විභාග පැවැත්වීම පිණිස ;

(ඈ) නියමයට අනුකූලව, (ආ) ඡේදය යටතේ සාදන ලද රීති මගින් නියම කරන ලද සියලු කොන්දේසි ඉටු කර ඇති සහ නියමිත විභාග සමර්ථවී ඇති ශිෂ්‍යයන්ට සාමාජිකත්ව උපාධි ප්‍රදානය හා පිරිනැමීම පිණිස ;

(ඉ) ආයතනයේ පරිපාලනය සඳහා අවශ්‍ය වියහැකි කාර්ය මණ්ඩලය සේවයෙහි නියුක්ත කිරීම පිණිස ; සහ

(ඊ) ආයතනයේ කාර්ය මණ්ඩලයේ හා ශිෂ්‍යයන්ගේ ශුභසාධනය සඳහා අවශ්‍යවන වෙනත් ක්‍රියාවන් කිරීම පිණිස

බලතල ද තිබිය යුත්තේ ය.

25. (1) පහත සඳහන් අන්දමින් සමන්විත වූ, (මෙහි මින්මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) කොමිෂන් සභාවේ සාමාජිකත්ව උපාධි කමිටුවක් පිහිටුවනු ලැබිය යුතුය :— සාමාජිකත්ව උපාධි කමිටු.

(අ) කොමිෂන් සභාවේ සභාපතිවරයා නිලබලයෙන් කමිටුවේ සභාපතිවරයා විය යුතුය ;

(ආ) කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙක් ;

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන එක් සාමාජිකයෙක් ; සහ

(ඈ) ජාතික අධ්‍යාපන ආයතනය විසින් නම් කරනු ලබන එක් සාමාජිකයෙක්.

(2) කමිටුවේ සාමාජිකයන් විසින් අවුරුදු හතරක කාලසීමාවක් සඳහා ධුර දැරිය යුතුය.

(3) 24 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ නියමයක් කිරීමට මත්තෙන්, අමාත්‍යවරයා විසින් ඒ ආයතනයේ සලස්වා ඇති අධ්‍යාපන පහසුකම් ඇතුළුව ඒ ආයතනය ට අදාළව වාර්තාවක් කමිටුවෙන් ලබාගත යුතු ය.

(4) කමිටුව විසින් පහත දැක්වෙන බලතල ක්‍රියාත්මක කළ යුතුය :—

(අ) සාමාජිකත්ව උපාධියක් ප්‍රදානය කිරීමට තුඩුදෙන අධ්‍යයන පාඨමාලා සඳහා ශිෂ්‍යයන් ඇතුළත් කරගැනීම සඳහා වන අවශ්‍යතා තීරණය කිරීම ;

(ආ) නියමයේ නිශ්චිතව සඳහන් කර ඇති පරිදි, ඒ අධ්‍යයන අංශවල අධ්‍යයන පාඨමාලා වන්නාවූ, එක් එක් ආයතනයේ සලස්වාලිය යුතු අධ්‍යයන පාඨමාලා සහ එවැනි පාඨමාලා හදාරන ලද ශිෂ්‍යයන් විසින් ඒවා ගැන ප්‍රවීනත්වයක් ලබාගෙන තිබේද යන වග දැනගැනීම පිණිස පැවැත්විය යුතු විභාග තීරණය කිරීම ;

(ඇ) යම් සංවර්ධන සැලැස්මක් අනුව එවැනි එක් එක් ආයතන යට වාර්ෂිකව ඇතුළත් කළයුතු ශිෂ්‍ය සංඛ්‍යාව කලින් කල තීරණය කිරීම සහ ඒ ආයතනවල පවත්වනු ලබන වෙනස් වෙනස් අධ්‍යයන පාඨමාලාවලට ඒ සංඛ්‍යාව පත්කිරීම ;

(ඈ) ඒ ආයතනවල ආචාර්ය මණ්ඩලයේ සුදුසුකම් තීරණය කිරීම ; සහ

(ඉ) ඒ ආයතනවල සැලැස්විය යුතු පහසුකම් සහ පවත්වාගත යුතු අධ්‍යයන තත්වය තීරණය කිරීම.

(5) මේ වගන්තියේ කාර්ය සඳහා "ආයතන" යන්නට, උසස් අධ්‍යාපන ආයතන, සාමාජිකත්ව උපාධි ආයතන සහ අනුබද්ධිත විද්‍යාල ඇතුළත් වේ.

24 වන වගන්තිය යටතේ කරන ලද නියමය ප්‍රත්‍යාදිෂ්ට කිරීම.

26. (1) අමාත්‍යවරයා විසින්, කොමිෂන් සභාවේ නිර්දේශය මත, 24 වන වගන්තිය යටතේ කරන ලද යම් නියමයක් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකිය.

(2) කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන යම් එක් හේතුවක් උඩ හෝ හේතු වැඩි ගණනක් උඩ, යම් සාමාජිකත්ව උපාධි ආයතන යක් සම්බන්ධයෙන් වූ එවැනි යම් නියෝගයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීම නිර්දේශ කරනු ලැබිය හැකිය :—

(අ) ජාතික ප්‍රතිපත්තිය උල්ලංඝනය වන අයුරින් ක්‍රියා කිරීම ;

(ආ) අදාළ සංවර්ධන සැලැස්මට අනුකූලවීමට නොහැකිවීම ; හෝ

(ඇ) 24 වන වගන්තිය යටතේ පනවා ඇති යම් කොන්දේසියක් කඩකිරීම සහ ඒ කඩකිරීමෙන්—

(i) ඒ ආයතනයේ අධ්‍යාපන විධිවිධාන සඳහා ඇති පහසු කම් ප්‍රමාණවත් නොවීම ; හෝ

(ii) ආයතනයේ අධ්‍යාපනය, ජාතික යහපතට හෝ තෘතීයික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනික ප්‍රතිපත්ති යට හෝ බලපාන ලෙස අනුකූල නොවීම ;

(ඈ) සාමාජිකත්ව උපාධි ප්‍රදානය කිරීම පිණිස විභාග නොපැවැත් වීම හෝ අවිධිමත් ලෙස පැවැත්වීම ; සහ

(ඉ) අධ්‍යාපනික කටයුතු අවුල්වීමට මගපාදෙන ලෙස ආයතනය අයුතු අන්දමින් කළමනාකරණය කිරීම.

(3) (අ) සාමාජිකත්ව උපාධි ආයතනයක් සම්බන්ධයෙන් නිර්දේශයක් කිරීමට ප්‍රථම, කොමිෂන් සභාව විසින්, ආයතනය වෙත යවනු ලබන දැන්වීමක් මගින්, ඒ දැන්වීමේ නිශ්චිතව දක්වනු ලබන කාලයක් ඇතුළත, ඒ ආයතනය වෙනුවෙන් 24 වන වගන්තිය යටතේ කරන ලද නියමය ප්‍රත්‍යාදිෂ්ට කරන ලෙස අමාත්‍යවරයාට නිර්දේශ නොකළ යුත්තේ කුමක් නිසාදැයි නිදහසට කරුණු දක්වන ලෙස ඒ ආයතනයට නියම කරනු ලැබිය යුතුය ;

(ආ) ඉඩ දෙන ලද කාලසීමාව ඇතුළත නිදහසට කරුණු දැන්වීම ආයතනය විසින් නොකර ඇති විට හෝ කොමිෂන් සභාව සෑහීමට පත්වන ආකාරයට නිදහසට කරුණු දක්වා නොමැති අවස්ථාවක, ඒ ආයතනය වෙනුවෙන් 24 වන වගන්තිය යටතේ කර ඇති නියමය ප්‍රත්‍යාදිෂ්ට කරන ලෙස කොමිෂන් සභාව විසින් අමාත්‍යවරයාට නිර්දේශ කළ යුතු ය. ඒ නිර්දේශයේ පිටපතක් කොමිෂන් සභාව විසින් ඒ ආයතනයට යැවිය යුතු ය.

(4) නිර්දේශය ලැබීමෙන් පසු අමාත්‍යවරයා විසින්, සති හයක කාලයක් ඉකුත් වීමෙන් පසු 27 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් එකී නියමය ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකිය.

(5) (අ) 27 වන වගන්තිය යටතේ අභියාචනාධිකරණය වෙත අභියාචනයක් කර නොමැති අවස්ථාවක අභියාචනාධිකරණය වෙත අභියාචනයක් කළ යුත්තේ කවර කාලසීමාවක් ඇතුළතද ඒ කාලසීමාව ඉකුත්වීමෙන් පසු ;

(ආ) අභියාචනාධිකරණය වෙත අභියාචනයක් කර ඇති අවස්ථාවක, අභියාචනාධිකරණය විසින් කොමිෂන් සභාවේ නිර්දේශය ස්ථිර කිරීමෙන් පසු

කොමිෂන් සභාවේ නිර්දේශය උඩ, අමාත්‍යවරයා විසින් 26 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නියමයක් කරනු ලැබිය හැකිය.

**27.** 26 වන වගන්තිය යටතේ කරන ලද නිර්දේශයකින් අතෘප්තියට පත් යම් ආයතනයක් විසින්, කොමිෂන් සභාව විසින් ඒ නිර්දේශය කිරීමෙන් සති හයක් ඇතුළත, යම් නීති ප්‍රශ්නයක් මත, අභියාචනාධිකරණය වෙත අභියාචනය කරනු ලැබිය හැකි ය. ප්‍රත්‍යාදිෂ්ට කිරීමට විරුද්ධ අභියාචනය.

එවැනි අභියාචනයක් සම්බන්ධයෙන් 21 වන වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

## V වන පරිච්ඡේදය

### විවිධ

**28.** (1) නියෝග ඇදීමට මේ පනතේ මේ කොටසින් බලය දී ඇත්තාවූ හෝ නියම කළ යුතු යයි ඉන් නියමිතව ඇත්තා වූ කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය. නියෝග.

(2) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබිය යුතු අතර, එය එසේ පළකරනු ලැබූ දින සිට හෝ නියෝගයෙහි සඳහන් යම් පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතුය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබීමෙන් පසු, හැකි පහසු ඉක්මණින්, අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතුය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එම අනනුමතයේ දින සිට, ඒ නියෝගය යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැතිව, පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය.

(4) යම් නියෝගයක්, එසේ පරිච්ඡින්න කරන ලදැයි සලකනු ලබන දිනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතුය.

අධ්‍යක්ෂ ජනරාල් විසින් අධිකරණය වෙත කරනු ලබන ඉල්ලීම.

29. (1) (අ) 14 වන වගන්තියේ විධිවිධාන යටතේ ලියාපදිංචි නොකරන ලද ආයතනයක් විසින් යම් තෘතියික අධ්‍යයන පාඨමාලාවක් හෝ වෘත්තීය අධ්‍යයන පාඨමාලාවක් පවත්වාගෙන යන අවස්ථාවක ; හෝ

(ආ) 15 වන වගන්තියේ විධිවිධාන යටතේ ලියාපදිංචි කරනු නොලැබ යම් තැනැත්තකු හෝ ආයතනයක් විසින් යම් නියමිත පාඨමාලාවක් පවත්වාගෙන යන අවස්ථාවක ; හෝ

(ඇ) 16 වන වගන්තියේ විධිවිධාන යටතේ ලියාපදිංචි කරනු නොලැබ, යම් තැනැත්තකු හෝ ආයතනයක් විසින් යම් විභාගයක් පවත්වාගෙන යන අවස්ථාවක ; හෝ

(ඈ) 24 වන වගන්තියේ විධිවිධාන යටතේ කරන ලද නියමයකින් පිළිගත් ආයතනයක් නොවන්නා වූ යම් ආයතනයක් විසින් යම් සාමාජිකත්ව උපාධියක් ප්‍රදානය කරන අවස්ථාවක

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් (3) වන උපවගන්තියේ විධිවිධාන යටතේ වූ ආඥාවක් සඳහා අධිකරණයට ඉල්ලුම් කරනු ලැබ සිටිය හැකිය.

(2) (අ) යම් ආයතනයක් 14 වන වගන්තියේ විධිවිධාන යටතේ ලියාපදිංචි කර නැති බවට ; හෝ

(ආ) යම් නියමිත පාඨමාලාවක් 15 වන වගන්තියේ විධිවිධාන යටතේ ලියාපදිංචි කර නැති බවට ; හෝ

(ඇ) යම් විභාගයක් 16 වන වගන්තියේ විධිවිධාන යටතේ ලියාපදිංචි කර නැති බවට ; හෝ

(ඈ) සාමාජිකත්ව උපාධි ප්‍රදානය කිරීම සඳහා වූ යම් ආයතනයක්, 24 වන වගන්තියේ විධිවිධාන යටතේ කරන ලද නියමයක් මගින් පිළිගෙන නැති බවට

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද යම් සහතිකයක්, ඒ සහතිකයේ සඳහන් කර ඇති කරුණු පිළිබඳව බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතුය.

(3) විභාග කිරීමෙන් පසු—

(අ) 14 වන වගන්තියේ විධිවිධාන යටතේ ලියාපදිංචි නොකරන ලද යම් ආයතනයක් විසින්, යම් තෘතීයික අධ්‍යයන පාඨමාලාවක් හෝ වෘත්තීය අධ්‍යයන පාඨමාලාවක් පවත්වාගෙන යන බවට; හෝ

(ආ) 15 වන වගන්තියේ විධිවිධාන යටතේ ලියාපදිංචි නොකරන ලද යම් තැනැත්තකු හෝ ආයතනයක් විසින් යම් නිශ්චිත පාඨමාලාවක් පවත්වාගෙන යන බවට; හෝ

(ඇ) 16 වන වගන්තියේ විධිවිධාන යටතේ ලියාපදිංචි නොකර යම් තැනැත්තකු හෝ ආයතනයක් විසින්, යම් විභාගයක් පවත්වන බවට ; හෝ

(ඈ) 24 වන වගන්තියේ විධිවිධාන යටතේ කරන ලද නියමය කිසි පිළිනොගන්නා ලද යම් ආයතනයක් විසින් යම් සාමාජිකත්ව උපාධියක් ප්‍රදානය කරන බවට

අධිකරණය සෑහීමට පත් වූ අවස්ථාවක—

(i) (අ) අනුඡේදයේ සඳහන් යම් ආයතනයක් කළමනාකරණය කරන යම් තැනැත්තකු විසින් යම් තෘතීයික අධ්‍යාපන පාඨමාලාවක් හෝ වෘත්තීය අධ්‍යාපන පාඨමාලාවක් පැවැත්වීම තහනම් කරමින් ; හෝ

(ii) යම් තැනැත්තකු විසින් හෝ (ආ) අනුඡේදයේ සඳහන් යම් ආයතනයක් කළමනාකරණය කරන තැනැත්තකු විසින් යම් නිශ්චිත පාඨමාලාවක් පැවැත්වීම තහනම් කෙරෙමින් ; හෝ

(iii) යම් තැනැත්තකු හෝ යම් ආයතනයක් කළමනාකරණය කරන යම් තැනැත්තකු විසින් (ඇ) අනුඡේදයේ සඳහන් විභාගයක් පැවැත්වීම තහනම් කරමින් ; හෝ

(iv) (ඈ) අනුඡේදයේ සඳහන් යම් ආයතනයක් කළමනාකරණය කරන යම් තැනැත්තකු විසින්, එකී ඉල්ලීම සම්බන්ධයෙන් උචිත වන සාමාජිකත්ව උපාධියක් ප්‍රදානය කිරීම තහනම් කරමින්

අධිකරණය විසින් ආඥාවක් කළ යුතුය.

(4) (1) වන උපවගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් සම්බන්ධයෙන් අධිකරණය විසින් තීරණය කරනු ලබනතුරු හා ඒ කාර්යය සඳහා ඊට සුදුසු යයි හැඟෙන ආඥාවක් අධිකරණය විසින් කරන තෙක් 14 වන, 15 වන, 16 වන හා 24 වන වගන්තිවල විධිවිධාන උල්ලංඝණය කිරීම වැළැක්වීම පිණිස, යම් අතුරු ආඥාවක් සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකිය.

**ඇතැම් ආයතන ලියාපදිංචි කිරීමෙන් නිදහස් කිරීම.**

**30.** (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දින සිට එක් අවුරුද්දකට නොවැඩි කාලසීමාවක් සඳහා, 14 වන වගන්තියේ විධිවිධාන යටතේ යම් ආයතනයක් හෝ යම් ආයතන වර්ගයක් ලියාපදිංචි කිරීමෙන් අමාත්‍යවරයා විසින් නිදහස් කරනු ලැබිය හැකිය.

(2) 14 වන වගන්තියේ විධිවිධාන යටතේ ආයතන ලියාපදිංචි කිරීම සඳහා හෝ 16 වන වගන්තියේ විධිවිධාන යටතේ විභාග ලියාපදිංචි කිරීම හෝ අමාත්‍යවරයා විසින් යම් අතුරු නියෝගයක් මගින් නියම කරනු ලැබිය හැකිය. එවැනි යම් නියෝගයක්, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනය සහ අදාළ සංවර්ධන සැලැස්ම පලකරනු ලබන දිනය යන දින දෙකෙන් කලින් එළඹෙන දිනයේ සිට අවුරුදු තුනක් නොඉක්මවන කාල සීමාවක් සඳහා බලාත්මක විය යුතුය.

**ඇතැම් ව්‍යවස්ථාපිත මණ්ඩල 14 වන සහ 16 වන වගන්තිවල විධිවිධානවලින් නිදහස් කිරීම.**

**31.** තෘතීයික අධ්‍යාපනය සැලැස්වීම සහ යම් වෘත්තීන් සම්බන්ධයෙන් සහතික කිරීම තම අරමුණු වන සහ පාර්ලිමේන්තු පනතකින් පිහිටුවන ලද යම් ව්‍යවස්ථාපිත ආයතනයකින් සලස්වනු ලබන අධ්‍යාපනය සහ පවත්වනු ලබන විභාග ප්‍රමාණවත් තත්ත්වයෙන් පවතින බවට සහ ඒවා ජාතික ප්‍රතිපත්තිවලට අනුකූල වන බවට අමාත්‍යවරයා සෑහීමට පත් වූ අවස්ථාවක, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පලකරනු ලබන නියමයක් මගින් එම ව්‍යවස්ථාපිත ආයතනය සම්බන්ධයෙන් 14 වන සහ 16 වන වගන්තිවල විධිවිධාන අදාළ නොවන පරිදි ඒ ආයතනය නිදහස් කළ හැකි ය.

**කොමිෂන් සභාව විසින් වාර්තාවක් ඉදිරිපත් කිරීම.**

**32.** (1) සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා ගන්නා ලද පියවර ගැන කොමිෂන් සභාව විසින් කලින් කල ජනාධිපතිවරයාට වාර්තා කළ යුතුය.

(2) එක් එක් මුදල් වර්ෂය අවසානවීමෙන් පසු හය මාසයක් කාලසීමාවක් ඉකුත්වීමට පෙරාතුව, කොමිෂන් සභාව විසින් ඒ වර්ෂය තුළ එහි වැඩ කටයුතු පිළිබඳ සම්පූර්ණ විස්තරයක් ගෙන හැර දක්වන වාර්තාවක් අමාත්‍යවරයා වෙත යවනු ලැබිය යුතු අතර, අමාත්‍යවරයා විසින් එහි පිටපත් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට සැලැස්විය යුතුය.

**පනත අදාළ කිරීමෙන් නිදහස් කිරීම.**

**33.** මේ පනතේ විධිවිධාන—

(අ) 1981 අංක 68 දරන ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතන පනතින් පිහිටුවන ලද ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතනය ;

(ආ) 1981 අංක 74 දරන බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය පනතින් පිහිටුවන ලද බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය ; සහ

(ඇ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාල හා වෙනත් උසස් අධ්‍යාපන ආයතන

සම්බන්ධයෙන් අදාළ නොවිය යුතුය.

34. (185 වන අධිකාරය වූ) අධ්‍යාපන ආඥාපනතේ IV වන කොටස — පොදු — 37 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය මෙයින් ඉවත් කෙරේ. අධ්‍යාපන ආඥාපනතේ ඇතුළු වගන්ති ඉවත් කිරීම.

35. මේ පනතේ මේ කොටසේ, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස,— අර්ථ නිරූපණය.

"සාමාජිකත්ව උපාධිය" යනු—

(අ) විශ්වවිද්‍යාලයක හෝ ඒ හා සමාන ආයතනයක වැඩිදුරටත් අධ්‍යයනයෙහි යෙදීමේ කාර්ය සඳහා පිළිගත් ; හෝ

(ආ) වෘත්තියක නිරත වී සිටීමේ කාර්ය සඳහා පිළිගත් විශිෂ්ටතාවයක් වන්නා වූ නියමිත අධ්‍යාපන අංශයක අවුරුදු දෙකක අවම පුහුණුවකට පසු "සාමාජිකත්වය" යන අභිධානය දෙන ලද තෘතීයික අධ්‍යාපන විශිෂ්ටතාවයකි.

"අධ්‍යාපනය" යන්නට, පුහුණුවීම ඇතුළත් වේ.

## II වන කොටස

## VI වන පරිච්ඡේදය

### ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය පිහිටුවීම

36. (1) (මෙහි මින් මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන්නා වූ ද, 39 වන වගන්තිය යටතේ අධිකාරියේ සාමාජිකයන් ලෙස තත් කාලයෙහි පත් කරනු ලැබ ඇති තැනැත්තන්ගෙන් සමන්විත වූ ද අධිකාරියක් පිහිටුවනු ලැබිය යුතු ය. ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය පිහිටුවීම.

(2) අධිකාරිය, (1) වන උපවගන්තියෙන්, ඊට පවරනු ලැබූ නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර ඊට අවිච්ඡින්න පැවැත්මක් ඇත්තේ ය. තවද ඊට පොදු මුද්‍රාවක් තිබිය යුතු අතර, සංස්ථාපිත නාමයෙන් එය විසින් ද, ඊට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය.

37. (අ) වෘත්තීය පුහුණු කිරීම් සැලසුම් කිරීම, සංවිධානය කිරීම හා සැලැස්වීම ; අධිකාරියේ පරමාර්ථ.

(ආ) වෘත්තීය පුහුණුවට අදාළව සම්මතයන් නිශ්චය කිරීම ;

(ඇ) වෘත්තීය පුහුණුවට අදාළව විභාග පැවැත්වීම හා සහතික පත්‍ර සහ වෙනත් ප්‍රදානයන් නිකුත් කිරීම ;

(ඈ) ජාතික ශිල්පීය පරීක්ෂණ පැවැත්වීම ;

(ඉ) වෘත්තීය පුහුණුව පිළිබඳව පර්යේෂණ හා සංවර්ධන කාර්ය පැවැත්වීම ;

(ඊ) විවිධ දක්ෂතා වැඩිදියුණු කිරීම ප්‍රවර්ධනය පිණිස තරඟ පැවැත්වීම ;

(උ) වෘත්තීය පුහුණුව සලස්වන ආයතනවල සහ වෙනත් ආයතනවල පුහුණු කිරීමේ හැකියාවන් සංවර්ධනය කිරීම;

(ඌ) වෘත්තීය පුහුණු කිරීම් සම්බන්ධයෙන් සොමිෂන් සභාවට උපදෙස් දීම; සහ

(එ) සමාන පරමාර්ථ ඇති ශ්‍රී ලංකාවේ සහ විදේශවල පිහිටි ආයතන සමග සම්බන්ධතා පවත්වා ගැනීම සහ ආශ්‍රිත විෂයයන් හා පාඨමාලා සම්බන්ධයෙන් ඇති සහතික, ඩිප්ලෝමා සහ උපාධි සමතත්වයෙහි ලා සැලකීම සහ බලාත්මක කිරීම

අධිකාරියේ පරමාර්ථ විය යුතුය.

අධිකාරියේ බලතල.

38. අධිකාරිය විසින් පහත සඳහන් බලතල සියල්ලම හෝ ඉන් කිසිවක් ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය :—

(අ) අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද ක්ෂේත්‍රවල ජාතික ශිල්පීය පරීක්ෂණ පැවැත්වීම;

(ආ) වෘත්තීය පුහුණුව සම්බන්ධයෙන් වූ උපදේශකයන් පුහුණු කිරීම හා පුහුණු කිරීමේ පාලනය;

(ඇ) සියලුම තෘතීයික අධ්‍යාපන මට්ටමේ ආයතනවල දී යන්ත්‍රාගාර තුළ වෘත්තීය පුහුණුව පිළිබඳ ප්‍රතිපාදනය;

(ඈ) යන්ත්‍රාගාර තුළ පුහුණුවීම පිළිබඳ පුහුණු කිරීමේ පටිපාටිය සකස් කිරීම;

(ඉ) පුහුණු කිරීමේ ආයතනවල පුහුණු කිරීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා අමාත්‍යවරයා විසින් අනුමත කරන පරිදි වූ පියවර ක්‍රියාත්මක කිරීම;

(ඊ) අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව, වෘත්තීය පුහුණුව සඳහා යම් ආයතනයක් හෝ මධ්‍යස්ථානයක් පිහිටුවා කළමනාකරණය කිරීම;

(උ) අමාත්‍යවරයා විසින් එසේ කරන ලෙස විධාන කරනු ලැබූ කල්හි, යම් කරුණක් ගැන අමාත්‍යවරයාට උපදෙස් දීම;

(ඌ) ආධුනිකයන් ඇතුළුව විවිධ වර්ගවල පුහුණු වන්නන් තීරණය කිරීම; සහ

(එ) අධිකාරියේ පරමාර්ථ විධිමත් ලෙස කරගෙන යාම හෝ එහි කාර්ය නිසි ලෙස ඉටුකිරීම පහසු කිරීම පිණිස අවශ්‍ය යයි අධිකාරියේ මතය වන වෙනත් එවැනි සියලු දේ කිරීම.

අධිකාරියේ සංයුතිය.

39. (1) අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් අධිකාරිය සමන්විත විය යුතුය :—

(අ) සභාපතිවරයකුගෙන්;

(ආ) උප සභාපතිවරයකුගෙන්;

(ඇ) මෙහි මින්මතු "නිල බලයෙන් පත්වූ සාමාජිකයා" යනුවෙන් සඳහන් කරනු ලබන අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන්; සහ

(ඈ) (i) ආණ්ඩුවේ ආයතන, වෘත්තීය සමිති වාණිජ්‍යය හා කර්මාන්ත නියෝජනය කරන්නා වූ; හෝ

(ii) වෘත්තීය පුහුණු කිරීමට අදාළව විශේෂ දැනුමක් හෝ පළපුරුද්දක් ඇත්තා වූ

වෙනත් සාමාජිකයන් දෙළොස් දෙනෙකුට නොවැඩි ගණනකින්.

(2) නිල බලයෙන් පත්වන සාමාජිකයා හැර අධිකාරියේ සියලුම සාමාජිකයන් අවුරුදු හතරක කාලසීමාවකට පත් කරනු ලැබිය යුතු ය.

(3) සභාපතිවරයා විසින් සහ උප සභාපතිවරයා විසින්, ඔවුනට අධිකාරිය විසින් පවරා දෙනු ලැබිය හැකි බලතල ක්‍රියාත්මක කළ යුතු ය.

(4) එසේ කිරීම අවශ්‍යාවෝචිත යයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන්නේ නම්, ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින්, ඒ සඳහා කිසිදු හේතුවක් නොදක්වා, අමාත්‍යවරයා විසින්, නිලබලයෙන් පත්වන සාමාජිකයා හැර, අධිකාරියේ යම් සාමාජිකයකු ඉවත් කරනු ලැබිය හැකි අතර, ඒ ඉවත් කිරීම යම්කිසි අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් (4) වන උපවගන්තිය යටතේ නියමයක් කරනු ලැබුවේ අධිකාරියේ යම් සාමාජිකයකු සම්බන්ධයෙන්ද ඒ සාමාජිකයා විසින් ඒ නියමය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දිනයේ දී සිය ධුරය හිස් කළ යුතු ය.

(6) නිලබලයෙන් පත්වන සාමාජිකයා හැර, අධිකාරියේ යම් සාමාජිකයකු විසින් කවර හෝ අවස්ථාවක තත් කාර්ය වෙනුවෙන් අමාත්‍යවරයා වෙත යොමු කරන ලද ලිපියක් මගින්, සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, අමාත්‍යවරයා විසින් එය පිළිගැනීමෙන් පසු ඒ ඉල්ලා අස්වීම ක්‍රියාත්මක විය යුතු ය.

(7) නිලබලයෙන් පත්වන සාමාජිකයා හැර, අධිකාරියේ යම් සාමාජිකයකු මිය ගියහොත්, ඉල්ලා අස්වුවහොත් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත්, අමාත්‍යවරයා විසින්, මෙම වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන කෙරෙහි සැලකිල්ල ඇතිව මියගිය, ඉල්ලා අස්වූ හෝ ධුරයෙන් ඉවත් කරන ලද සාමාජිකයා වෙනුවට, සාමාජිකයකු වශයෙන් වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය. එවැනි සාමාජිකයකු වෙනුවට එසේ පත් කරන ලද යම් තැනැත්තකු තමා අනුප්‍රාප්ති වන සාමාජිකයාගේ ධුර කාලයේ ඉකුත් නොවූ කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

පුරප්පාඩුවක් තිබීමේ හේතුවෙන් ක්‍රියාවක් අවලංගු නොවීම ආදී.

**40.** අධිකාරියේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් හෝ යම් සාමාජිකයකුගේ පත්වීම පිළිබඳව වූ යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම, අධිකාරියේ කිසිම ක්‍රියාවක් හෝ ක්‍රියාපටිපාටියක් අවලංගු වූ ලෙස සලකනු නොලැබිය යුතු ය.

අධිකාරියේ මුද්‍රාව.

41. (1) අධිකාරියේ මුද්‍රාව අධිකාරියේ සභාපතිවරයා භාරයේ තිබිය යුතු අතර, අධිකාරිය විසින් තීරණය කරනු ලබන ආකාරයකින් වෙනස් කරනු ලැබිය හැකි ය.

(2) අධිකාරියේ සභාපතිවරයාගේ අත්සන තැබීමෙන් සහ මුද්‍රාව යෙදීමේ සත්‍යතාවය සහතික කිරීමට අධිකාරිය විසින් බලය දී ඇති අධිකාරියේ වෙනත් යම් නිලධරයකුගේ අත්සන තැබීමෙන්, අධිකාරියේ මුද්‍රාව යෙදීම සත්‍ය බවට සහතික කරනු ලැබිය යුතු ය.

අධිකාරියේ රැස්වීම්.

42. (1) යටත් පිරිසෙයින් මාස දෙකකට වරක්වත් අධිකාරියේ රැස්වීම් පැවැත්විය යුතු ය.

(2) අධිකාරියේ යම් රැස්වීමක ගණපූරණය, තත් කාර්ය සඳහා අධිකාරිය විසින් සාදන ලද රීති මගින් අධිකාරිය විසින් තීරණය කරනු ලබන පරිදි විය යුතු ය.

(3) අධිකාරියේ සෑම රැස්වීමකදී ම, සභාපතිවරයා හෝ ඔහු පැමිණ නොසිටියේ නම් උප සභාපතිවරයා හෝ ඒ දෙදෙනාම පැමිණ නොසිටියේ නම් පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරාගනු ලබන සාමාජිකයෙක් මූලසුන දැරිය යුතු ය.

(4) අධිකාරියේ යම් රැස්වීමක දී තීරණය කිරීම සඳහා වූ සියලු ප්‍රශ්න, පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්ද සංඛ්‍යාව සමාන වූ අවස්ථාවක, මූලසුන දරන සාමාජිකයාට තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(5) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවලට යටත්ව, අධිකාරියේ රැස්වීම් සම්බන්ධයෙන් ද ඒ රැස්වීම්වලදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් සහ කටයුතු කරගෙන යාම සම්බන්ධයෙන් මේ පනත යටතේ රීති සාදනු ලැබිය හැකි ය.

අධිකාරියේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

43. මුදල් පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින්, අධිකාරියේ සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික තීරණය කරනු ලැබිය යුතු ය.

අධිකාරිය සතු ණය ගැනීමේ බලතල.

44. අධිකාරියේ බැඳීම් ඉටු කිරීම සඳහා සහ මේ පනත යටතේ වූ බලතල, කර්තව්‍ය හා කාර්යයන් ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටුකිරීම සඳහා අධිකාරියට අවශ්‍ය විය හැකි මුදල් අධිකාරිය විසින් අමාත්‍යවරයා සහ මුදල් විෂයය භාර අමාත්‍යවරයා යන දෙදෙනාම විමසා හෝ එසේ විමසීමෙන් පසු දෙන ලද යම් පොදු අධිකාරයක නියමයන් අනුව හෝ අයිරාවක මාර්ගයෙන් හෝ අන්‍යාකාරයෙන් ණයට ගැනීම හෝ ණයට ගැනීමේ නියමයක් මත ණයට ගැනීමට කටයුතු කොට ලබා ගැනීම ද කළ හැකි ය :

එසේ වුව ද, අධිකාරිය විසින් මේ වගන්තිය යටතේ ගන්නා ලද යම් ණය මුදලක ගෙවීමට ඉතිරිව ඇති එකතු මුදල කවර හෝ වේලාවක, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි එවැනි මුදලකට වැඩි නොවිය යුතු ය.

අධිකාරියේ කමිටු.

**45.** (1) අධිකාරියේ කර්තව්‍යයන් ඉටු කිරීම පිණිස ඊට සහාය දීමට අධිකාරිය විසින් කමිටු පිහිටුවනු ලැබිය හැකි ය. එවැනි යම් කමිටුවක සාමාජිකයන් අධිකාරිය විසින් පත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අධිකාරිය විසින් පත් කරන ලද යම් කමිටුවකට අධිකාරියේ යම් කර්තව්‍යයක් පවරා දෙනු ලැබිය හැකි ය ; එසේ වුව ද එසින් එසේ පවරා දෙන ලද කර්තව්‍යවලින් යම් කර්තව්‍යයක් අධිකාරිය විසින් ඉටු කිරීමෙන් වලක්වා ලන බවත් සලකනු නොලැබිය යුතු ය. නැතහොත් තේරුම් නොගත යුතු ය. එවැනි පවරාදීමක ප්‍රතිඵලයක් වශයෙන් යම් කමිටුවක් විසින් කරන ලද යම් තීරණයක් සංශෝධනය කිරීමට හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීමට අධිකාරියට බලය තිබිය යුතු ය.

(3) යම් කමිටුවක සාමාජිකයන් විසින්, අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි පාරිශ්‍රමිකයක් අධිකාරියේ අරමුදලින් ලබාගත හැකි ය.

අමාත්‍යවරයා විසින් දෙනු ලබන විධාන.

**46.** (1) අමාත්‍යවරයා විසින් කලින් කල වෘත්තීය පුහුණුව පිළිබඳ පොදු ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් සහ යෝග්‍යයයි සලකනු ලබන වෙනත් එවැනි කරුණු සම්බන්ධයෙන් අධිකාරියට විශේෂ හෝ සාමාන්‍ය විධාන දෙනු ලැබිය හැකි අතර, එවැනි විධාන ඉටු කිරීම අධිකාරියේ කාර්යය විය යුතු ය :

එසේ වුව ද, වෙනත් අමාත්‍යවරයකු විසින් පවරන ලද විෂයයන්ට හෝ කර්තව්‍යයන්ට බලපාන අන්දමේ යම් කරුණක් සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ විධාන නිකුත් කිරීමේදී, ඒ අමාත්‍යවරයා විමසා ක්‍රියා කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දෙනු ලබන විධාන මේ පනත යටතේ පිළියෙල කරන ලද සංවර්ධන සැලැස්මට අනුකූල විය යුතු ය.

ප්‍රධාන විධායක නිලධරයා.

**47.** අධිකාරියේ සභාපතිවරයා අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය.

අධිකාරියේ කාර්ය මණ්ඩලයට පත් කිරීම හා ඔවුන්ගේ පුහුණුව සම්බන්ධයෙන් අධිකාරියේ බලතල.

**48.** (1) අවශ්‍ය යයි අධිකාරියට හැඟෙන නිලධරයන් සහ සේවකයන් අධිකාරියේ කාර්ය මණ්ඩලයට අධිකාරිය විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව, අධිකාරිය විසින්—

(අ) අධිකාරියේ කාර්ය මණ්ඩලය පත් කිරීම, සේවයෙන් පහ කිරීම සහ ඔවුන්ගේ විනය පාලනය කිරීම ද ;

(ආ) ඒ කාර්ය මණ්ඩලයේ වේතන හෝ වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික නියම කිරීම ද;

(ඇ) ඒ කාර්ය මණ්ඩලයේ සේවා නියමයන් හා කොන්දේසි තීරණය කිරීම;

(ඈ) ඒ කාර්ය මණ්ඩලයේ සුභසිද්ධිය සඳහා 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ විධිවිධානවල නියමයන්ට වඩා හිතකර වූ අර්ථසාධක අරමුදලක් හෝ යෝජනා ක්‍රමයක් ඇති කොට විධිමත් කිරීම හා ඒ අරමුදලට හෝ යෝජනා ක්‍රමයට දායක මුදල් ගෙවීම ද

කළ යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් සියලු හෝ යම් කරුණක් වෙනුවෙන් මේ පනත යටතේ රීති සෑදිය හැකි ය.

අධිකාරියේ කාර්ය මණ්ඩලයට වෙනත් සේවාවලින් නිලධාරීන් පත් කිරීම.

49. (1) අධිකාරියේ ඉල්ලීම පරිදි, රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු, ඒ නිලධරයාගේද රාජ්‍ය පරිපාලනය පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ ද කැමැත්ත ඇතිව, අධිකාරිය විසින්, ඒ හා සමාන කැමැත්තක් ඇතිව තීරණය කරනු ලැබිය හැකි යම් කාලයක් සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලික වශයෙන් පත් කරනු ලැබීම හෝ ඒ හා සමාන කැමැත්තක් ඇතිව එම කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කරනු ලැබීම හෝ කළ හැකි ය.

(2) රජයේ සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලික වශයෙන් පත් කරනු ලැබූ අවස්ථාවක ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහු වෙත හා ඔහු සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(3) රජයේ සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහු වෙත හා ඔහු සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(4) නිශ්චිත කාලයක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමග ගිවිසුමකට ඇතුළත් වී ඇති යම් තැනැත්තකු අධිකාරිය විසින් සේවයේ නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් අධිකාරියට සේවය කරනු ලබන යම් කාලයක් ඒ ගිවිසුමේ බැඳීම් ඉටුකිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරනු ලැබූ සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

පරීක්ෂකවරයා පත් කිරීම.

50. (1) අධිකාරියේ යම් නිලධරයකු හෝ සේවකයකු නාමින් හෝ ධුරයෙන් මේ පනතේ කාර්ය සඳහා පරීක්ෂකවරයකු ලෙස අධිකාරිය විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) සෑම පරීක්ෂකවරයකුටම, අධිකාරිය විසින් පරීක්ෂකවරයකු ලෙස පත් කිරීම පිළිබඳ සහතිකයක් සැපයිය යුතු ය. ඒ සහතිකය, මේ පනත යටතේ සාදන ලද රීතිවලින් විධිවිධාන සලසා ඇති පරිදි වූ ආකෘතියකින් විය යුතු අතර, එය යම් ආයතනයක් තුළ දී නියම

කරනු ලැබුවේ නම්, ඒ ආයතනයේ පදිංචිකරුට හෝ එහි කළමනාකාරීත්වයේ වගකිවයුතු තත්ත්වයක් දරන තැනැත්තකුට ඒ පරීක්ෂකවරයා විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

51. (1) තත් කාර්ය වෙනුවෙන් සාදන ලද රීතිවලට යටත්ව, පරීක්ෂකවරයකුට පහත සඳහන් සියලු හෝ යම් ක්‍රියාවක් කිරීම සඳහා බලය තිබිය යුතු ය:— පරීක්ෂකවරයාගේ බලතල.

(අ) මේ පනතේ කාර්ය සඳහා දිවා කාලයේ හෝ රාත්‍රියේ සියලු සාධාරණ වේලාවන් හි දී යම් ආයතනයකට ඇතුල් වී පරීක්ෂා කිරීම;

(ආ) යම් ආයතනයක, පුහුණු වෙමින් සිටින්නා වූ පුහුණුවන්නකු පරීක්ෂා කිරීම හෝ මේ පනතේ ප්‍රකාර ඒ ආයතනයේ පවත්වාගෙන යනු ලබන, යම් රෙජිස්ටරයක්, ලේඛනයක් හෝ වෙනත් ලියවිලි ඉදිරිපත් කරන ලෙස නියම කිරීම සහ මේ පනතේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය වේ යයි ඔහු විසින් සලකනු ලබන යම් තැනැත්තකුගේ යම් ප්‍රකාශයක් ඒ අවස්ථාවේදීම හෝ අන්‍යාකාරයෙන් ගැනීම;

(ඇ) මේ පනතේ විධිවිධාන ද තැතහොත් ඒ යටතේ සාදන ලද යම් රීතියක් හෝ නියෝග ද ඒ ආයතනයෙහි පිළිපදින්නේ ද යන වග සහතික කර ගැනීමේ කාර්ය සඳහා සුදුසු යයි තමා විසින් කල්පනා කරන පරිදි විභාග කිරීම සහ පරීක්ෂා කිරීම් පැවැත්වීම;

(ඈ) තමා විසින් පරීක්ෂා කරගෙන යනු ලබන යම් කරුණක් සම්බන්ධයෙන්, ඉහත කී බලතල ප්‍රකාර තමා ඇතුල් වූ පරිශ්‍රයෙහි හෝ ආයතනයෙහි තමාට හමුවන සෑම තැනැත්තකුම හෝ ඒ ආයතනයේ සේවයේ නියුක්ත කර සිටින බවට හෝ සේවයේ නියුක්ත කර සිටි බව විශ්වාස කිරීමට තමාට සාධාරණ හේතු ඇත්තා වූ සෑම තැනැත්තකුම හෝ මේ උපවගන්තියේ සඳහන් කරන ලද යම් දෙයක් සිය සන්තකයෙහි, භාරයෙහි හෝ පාලනයෙහි ඇත්තා වූ සෑම තැනැත්තකුම තනිව හෝ තමා විසින් සුදුසු යයි කල්පනා කරන අයුරු වෙනත් යම් තැනැත්තකු ඉදිරිපිට දී හෝ විභාග කර බැලීම;

(ඉ) (ඈ) ඡේදයේ සඳහන් කරන ලද යම් තැනැත්තකුට, තමා විසින් නියම කරනු ලබන වේලාවක දී සහ ස්ථානයක දී තමා හමුවෙයි පෙනී සිටින ලෙස නියම කිරීම සහ තමා විසින් විමර්ශනය කරගෙන යන යම් කරුණකට අදාළව ඒ තැනැත්තාගෙන් එවෙලේම ප්‍රශ්න කිරීම; සහ

(ඊ) නියම කරනු ලැබිය හැකි වෙනත් එවැනි බලතල ක්‍රියාත්මක කිරීම.

(2) යම් ආයතනයක අයිතිකරු හෝ පදිංචිකරු, ඔහුගේ නියෝජිතයන් සහ සේවකයන් විසින්, (1) වන උපවගන්තිය යටතේ පරීක්ෂකවරයකුගේ බලතල ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි පරිදි ඒ පරීක්ෂකවරයාට අවශ්‍ය වන උපාය මාර්ගයන් සහ පහසුකම් සියලු කල්හිම සපයා දිය යුතු ය.

බලතල, කර්තව්‍ය හා කාර්ය අධිකාරියේ නිලධරයන්ට හා සේවකයන්ට පවරා දීම.

52. අධිකාරිය විසින් එහි කිසියම් බලතල, කර්තව්‍ය හෝ කාර්ය අධිකාරියේ යම් නිලධරයකුට හෝ සේවකයකුට පවරා දිය හැකි අතර, එසේ පවරා දෙන ලද කිසියම් බලතල, කර්තව්‍ය හෝ කාර්ය ඒ නිලධරයා හෝ සේවකයා විසින්, අධිකාරියේ විශේෂ හෝ සාමාන්‍ය විධානවලට යටත්ව ක්‍රියාත්මක කිරීම සිදු කිරීම හෝ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

අධිකාරියේ අරමුදල.

53. (1) (මේ පනතේ මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) "ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවිය යුතු අතර, එය පහත සඳහන් මුදල්වලින් සමන්විත විය යුතුය :—

(අ) යම් විසර්ජන පනතක් මගින් හෝ පාර්ලිමේන්තුවේ සභා සම්මතයක් මගින් බලය දෙනු ලද ඒකාබද්ධ අරමුදලින් ගෙවෙන දායක මුදල් ;

(ආ) පුහුණු කිරීමේ ගාස්තු වශයෙන් මේ පනත යටතේ ගෙවනු ලබන හෝ අය කරගනු ලබන සියලු මුදල් ;

(ඇ) වෙනත් මාර්ගවලින් ලැබෙන ස්වේච්ඡා ප්‍රදාන හෝ දායක මුදල් ;

(ඈ) බැංකුවලින් හෝ වෙනත් මාර්ගවලින් ගත් ණය.

(2) අරමුදලින් පහත දැක්වෙන ගෙවීම් කරනු ලැබිය යුතුය :—

(අ) ලබාදෙන පුහුණුව වෙනුවෙන්, මේ පනතේ මේ කොටසේ විධිවිධාන යටතේ සේවායෝජකයන් විසින් දරන ලද අනුමත වියදම් ; සහ

(ආ) අධිකාරියේ අරමුණු ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා සහ අධිකාරියේ බලතල, කර්තව්‍ය හා කාර්ය ක්‍රියාත්මක කිරීම, සිදු කිරීම හා ඉටු කිරීම සඳහා අවශ්‍ය වන වෙනත් වියදම්.

(3) මේ පනතේ මේ කොටස යටතේ පුහුණුවීමේ විධිවිධාන සඳහා අවශ්‍ය යයි අධිකාරියේ උපදෙස් පිට අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන යම් වියදමක් (2) වන උපවගන්තියේ විධිවිධානවල කාර්ය සඳහා අනුමත වියදමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

අතිරික්ත මුදල්.

54. අධිකාරිය විසින් දරන ලද්දා වූ හෝ දැරීමට ඇත්තා වූ හෝ යම් හදිසි වියදමක් පියවීම පිණිස අවශ්‍ය නොකරන අරමුදලේ ඇති සියලු අතිරික්ත මුදල්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන නියමයන් මත, අධිකාරිය විසින් මහා භාණ්ඩාගාරයෙහි තැන්පත් කළ යුතු ය.

අධිකාරියේ ගිණුම්.

55. එක් එක් මුදල් වර්ෂය වෙනුවෙන් අධිකාරියේ ආදායම සහ වියදම පිළිබඳව ද එහි වෙනත් සියලු ගණුදෙනු පිළිබඳව ද නිසි ගිණුම් පොත් තබා ගැනීමට අධිකාරිය විසින් සැලැස්විය යුතු ය.

අධිකාරියේ මුදල් වර්ෂය.

56. (1) අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ වූ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, අධිකාරියේ ගිණුම් විගණනය කෙරෙහි අදාළ විය යුතු ය.

විගණකාධිපතිවරයාගේ වාර්තාව හා අධිකාරියේ වාර්ෂික කටයුතු පිළිබඳ වාර්තාව අමාත්‍යවරයා වෙත යැවිය යුතු බව.

57. එක් එක් වර්ෂයක විගණනය කළ ගිණුම් සහ විගණකාධිපතිවරයාගේ වාර්තාව ලැබුණු පසු, ඒ වාර්තාවට අදාළ වන මුදල් වර්ෂය තුළ අධිකාරියේ කටයුතු පිළිබඳව අධිකාරිය විසින් සකස් කරන ලද ප්‍රකාශයක් ද සමඟ ඒ වාර්තාව සහ ඒ ගිණුම් අධිකාරිය විසින් අමාත්‍යවරයා වෙත යැවිය යුතු අතර, ඔහු විසින්, ඒ ගිණුම් අදාළ වන, අධිකාරියේ මුදල් වර්ෂය අවසාන වී මාස දොළහක් ඇතුළත එහි පිටපත් පාර්ලිමේන්තුව හමුවෙහි තබනු ලැබිය යුතු ය.

සංවර්ධන සැලැස්ම සඳහා ලෙස කොමිෂන් සභාවට අමාත්‍යවරයා විසින් විධාන කළ හැකි බව.

58. (1) ශ්‍රී ලංකාවෙහි වෘත්තීය පුහුණුව සංවර්ධනය කිරීම සඳහා 11 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව සංවර්ධන සැලැස්මක් සකස් කරන ලෙස අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවට විධාන කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද සංවර්ධන සැලැස්මෙන්—

(අ) මූලික පුහුණුව, වැඩිදුර පුහුණුව හා යළි පුහුණුව සඳහා මාර්ගෝපදේශ ;

(ආ) වෘත්තීය පුහුණුවීමේ කාර්ය සඳහා ලබාගත හැකි පුහුණු කිරීමේ ස්ථාන ගණන ;

(ඇ) වෙනස් වෙනස් වර්ගවල පුහුණුවීම් වෙනුවෙන් පුහුණු කළ යුතු පුහුණු වන්නන්ගේ උපරිම සංඛ්‍යාව ;

(ඈ) පුහුණු වන්නන් සඳහා නිර්දේශ පත්‍ර සකස් කිරීමේදී පිළිපැදිය යුතු මාර්ගෝපදේශ ;

(ඉ) පුහුණු වන්නන් ලෙස තෝරා ගැනීම සඳහා තිබිය යුතු සුදුසුකම් ;

(ඊ) සහතික පත්‍ර සහ වෙනත් විශිෂ්ඨතාවන් ප්‍රදානය කිරීම සඳහා පුහුණු වන්නන් පරීක්ෂා කළ යුතු හා විභාග කළ යුතු ආකාරය ;

(උ) කාර්ය මණ්ඩලයේ සුදුසුකම් ;

(ඌ) මේ පනතේ 14 වන වගන්තිය යටතේ ලියාපදිංචි කරන ලද ආයතනවල හා විශ්ව විද්‍යාලවල ශිෂ්‍යයන් සඳහා යන්ත්‍රස්ථ පුහුණුව පිළිබඳ විධිවිධාන ; සහ

(එ) විවිධ වර්ගවල ආධුනිකයන්ගේ හා පුහුණු වන්නන්ගේ සාමාන්‍ය අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපනය පුළුල් කිරීම සහ ඒ සාමාන්‍ය අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපනය සලස්වා දිය යුතු ආකාරය

සඳහා විධිවිධාන සැලැස්විය යුතු ය.

(3) සංවර්ධන සැලැස්ම ඉටු කරමින් ක්‍රියා කිරීම අධිකාරියේ කාර්යය විය යුතු අතර, එවැනි සැලැස්මකට අනුව ක්‍රියා කිරීමට අධිකාරිය අපොහොසත් වන අවස්ථාවක, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, ඒ සැලැස්මට පටහැනිව අධිකාරිය විසින් නිකුත් කර ඇති යම් උපදෙස්වල ප්‍රතිශෝධනය හෝ සංශෝධනය සඳහා කොමිෂන් සභාව විසින් නියමයන් නිකුත් කරනු ලැබිය හැකි අතර, අධිකාරිය විසින් ඒ නියමයන් ඉටු කළ යුතු ය.

(4) කොමිෂන් සභාව විමසා, අමාත්‍යවරයා විසින් යම් සංවර්ධන සැලැස්මකට අනුව, අධිකාරිය විසින් ප්‍රදානය කළ යුතු සහතික පත්‍ර නියම කරනු ලැබිය යුතු ය.

මූලික පුහුණුව.

59. පුහුණු වන්නකුට ක්‍රමානුකූල පුහුණුවීමේ වැඩ සටහනක් තුළින්, වෘත්තියක් සඳහා පුළුල් ලෙස පදනම් වූ මූලික සූදානම් කිරීමක් සහ ඒ වෘත්තියේ යෙදීම පිණිස අවශ්‍ය කාර්මික දක්ෂතාවය හා දැනුමක් ලබාදීම මූලික පුහුණුවේ අරමුණ විය යුතු ය.

මූලික පුහුණුව සැලැස් විය යුතු වෘත්තීන් අමාත්‍යවරයා විසින් නියම කළ යුතු බව.

60. (1) අමාත්‍යවරයා විසින් කලින් කළ මූලික පුහුණුව සලස්වාලිය යුතු වෘත්තීන් නියෝග මගින් නියම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ නියෝගවලින්—

(අ) මූලික පුහුණුව සැලැස්විය යුතු (මෙහි මින්මතු " පුහුණුවීමේ වෘත්ති " යනුවෙන් සඳහන් කරනු ලබන) වෘත්තීන් ;

(ආ) පුහුණුවීමේ කාලසීමාව ;

(ඇ) පුහුණුවීමේ පාඨමාලාවේදී බෙදා දිය යුතු දක්ෂතාවයන් හා දැනුම ;

(ඈ) තිබේ නම්, ආදියරෙන් අදියර පුහුණුව ;

(ඉ) පුහුණුව ලබන පරිශ්‍රයෙන් පිටත දී දෙන පුහුණුව ;

(ඊ) පවත්වා ගතයුතු පරීක්ෂණ සම්මතයන් ;

(උ) අමාත්‍යවරයාගේ මතය අනුව, අවශ්‍ය වේ යයි සලකනු ලබන හා මූලික පුහුණුවේ විධිවිධානවලට සම්බන්ධිත එවැනි වෙනත් කරුණු

සඳහා ඉඩකඩ සැලසිය යුතු ය.

(3) අධිකාරිය විසින් නියෝගවලට අනුව, නිර්දේශ පත්‍ර, කාල සටහන් සහ එකී පුහුණුවීමේ වගන්ති සම්බන්ධයෙන් වූ මූලික පුහුණුවට අදාළ වන වෙනත් කරුණක් නිශ්චිතව සඳහන් කරමින් පුහුණුවීමේ නියෝග නිකුත් කළ යුතු ය.

(4) පුහුණුවීමේ වෘත්තියක පිළිගැනීම අමාත්‍යවරයා විසින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ නමුත්, මූලික පුහුණුව පිළිබඳ ගිවිසුම අවසන් නොකරන ලද අවස්ථාවක, ඒ ගිවිසුම සම්බන්ධයෙන්, මෙතෙක් බලාත්මකව පැවැතියා වූ විධිවිධාන අදාළ විය යුතු ය.

පුහුණුවීමේ ස්ථාන වලින් පිටතවූ ආයතන වලදී මූලික පුහුණුවට ඉඩ සැලැස්වීම සඳහා විධිවිධාන ඇති කිරීම.

**61.** (1) 60 වන වගන්තිය යටතේ නිකුත් කරන පුහුණුවීමේ නියමයන්හි, මූලික පුහුණුවේ විධිවිධාන සඳහා එවැනි වැඩ පිළිවෙලක් අවශ්‍ය යයි සහ උපකාරී වන්නේ යයි අධිකාරිය සලකන්නේ නම් සහ එසේ අවශ්‍ය හා උපකාර වනතාක් දුරට, පුහුණුවීමේ ස්ථානවලින් පිටත සුදුසු ආයතනවලදී මූලික පුහුණුවේ කොටසක් සැලැස්වීම සඳහා විධිවිධාන සලස්වනු ලැබිය හැකි ය.

(2) මේ පනතේ මේ කොටසේ විධිවිධාන යටතේ මූලික පුහුණුව සඳහා තෝරා ගන්නා ලද යම් පුහුණුවන්නන් හට සාමාන්‍ය හා වෘත්තීය අධ්‍යාපනය ලබාදීම සඳහා ආයතනය විසින් යම් ආයතනයක් සමග ගිවිසුමකට එළඹිය හැකි ය.

දෙනු ලැබිය යුතු පුහුණුවේ ස්වභාවය.

**62.** (1) පුහුණුවෙන් කරන වෘත්තියක් සඳහා වූ මූලික පුහුණුව, අදාළ පුහුණුවීමේ නියමයට අනුව පමණක් දෙනු ලැබිය යුතු ය.

(2) පුහුණුවෙන් කරන වෘත්තියක් හැර වෙනත් වෘත්තීන් සඳහා වූ මූලික පුහුණුව, ඒ පුහුණුව මගින් වයස අවුරුදු දහඅටට අඩු තැනැත්තන් පසුව එළඹෙන උපදේශ පාඨමාලාවකට සූදානම් කිරීම අදහස් කරන්නේ නම් මිස, එවැනි තැනැත්තන්ට නොදිය යුතු ය.

(3) පුහුණු කිරීමේ අළුත් ක්‍රම සහ මූලික පුහුණුව දිය යුත්තේ කවර අළුත් වෘත්තීන් වෙනුවෙන් ද ඒ අළුත් වෘත්තීන් වර්ධනය කිරීමේ හා තක්සේරු කිරීමේ අරමුණ ඇතිව, අධිකාරියේ උපදෙස් පිට සහ කොමිෂන් සභාව විමසීමෙන් පසු අමාත්‍යවරයා විසින්, කලින් කල මූලික පුහුණුව සැලැස්විය යුතු වන්නේ කවර වෘත්තීන් වෙනුවෙන් ද, ඒ වෘත්තීන් නියම කරමින්, 60 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ නියෝග සාදනු ලැබිය හැකි ය.

පුහුණුවන්නන්ගේ සුදුසුකම්.

**63.** මේ පනතේ මේ කොටසේ විධිවිධාන යටතේ පුහුණුවන්නන් ලෙස යෙදවීම සඳහා—

(අ) ඒ තැනැත්තා වයසින් අවුරුදු දහසයකට වඩා අඩු නම්, සහ

(ආ) පුහුණුව දිය යුතු වූද තමා හැදෑරීමට බලාපොරොත්තු වන්නාවූ ද ඒ විශේෂ පුහුණුවීමේ වෘත්තිය හෝ වෙනත් යම් වෘත්තියක් කෙරෙහි නියමිත අධ්‍යාපන තත්ත්වයන් සහ ශාරීරික යෝග්‍යතාවයන් ඔහු විසින් සැපිමට පත්කර ඇත්තේ නම් මිස

සුදුසුකම් නොලැබිය යුතු ය.

ගිවිසුම.

**64.** (1) පුහුණුවන්නකුට මූලික පුහුණුව සැලැස්වීමේ කාර්ය සඳහා ඒ පුහුණුවන්නා යොදවා ගැනීමට අදහස් කරන යම් සේවා යෝජකයකු විසින්, ඔහු එසේ යෙදවීමට කලින්, ඒ පුහුණුවන්නා සමග (මෙහි මින්මතු "ගිවිසුම" යනුවෙන් සඳහන් කරනු ලබන) මූලික පුහුණුවීමේ ගිවිසුමකට ඇතුළත් විය යුතු ය. ඒ ගිවිසුම ඔහු විසින් අධිකාරියෙහි ලියාපදිංචි කළ යුතු ය.

(2) පුහුණුවන්නන් යොදවා ගැනීමට අදහස් කරන සියලු සේවා යෝජකයන් විසින් පුහුණුවන්නන් යෙදවීම සඳහා සිය ආයතනයේ ඇති පුරප්පාඩු සංඛ්‍යාව සහ ඒවායේ ස්වභාවය අධිකාරිය වෙත දැනුම්දීම ඔවුන්ගේ යුතුකම විය යුතු ය.

ගිවිසුම්වල ලිඛිත ආකෘති.

**65.** (1) 64 වන වගන්තියේ සඳහන් කරන ලද ගිවිසුම ලියවිල්ලකින් විය යුතු අතර අධිකාරිය විසින් තීරණය කරනු ලැබිය යුතු පහත දැක්වෙන විස්තරවලින් යම් කිසි එක් විස්තරයක් හෝ වැඩි ගණනක් එහි අඩංගු විය හැකි ය :—

(අ) පුහුණුවේ ස්වභාවය, නිර්දේශ පත්‍ර, කාල සටහන සහ අරමුණු සහ විශේෂයෙන්ම පුහුණුව සලස්වනු ලබන්නේ කවර වෘත්තීන් සඳහා ද යන වග ;

(ආ) පරිවාස කාලසීමාව, එසේ වුවද ඒ කාලසීමාව මාස එකකට අඩු නොවිය යුතු අතර මාස තුනකට වැඩි නොවිය යුතු ය ;

(ඇ) මූලික පුහුණු කාලයේ ආරම්භය සහ කාලසීමාව ;

(ඈ) පුහුණුවීමේ ස්ථානයෙන් පිටතදී අනුගමනය කළ යුතු යම් පුහුණුවීමේ වැඩසටහනක් ;

(ඉ) පුහුණුවේ සාමාන්‍ය දෛනික පැය ගණන ;

(ඊ) මූලික පුහුණුවේ කාලසීමාව තුළදී පුහුණුවන්නාට හිමිවිය යුතු දීමනාවක් ගෙවීම සහ එසේ ගෙවිය යුතු ප්‍රමාණයන් අදාළ කිරීම ;

(උ) මූලික පුහුණුවේ කාලසීමාව තුළදී පුහුණුවන්නාට හිමිවිය යුතු නිවාඩුවල ප්‍රමාණය ;

(ඌ) ගිවිසුම අවසන් කිරීමේ දැන්වීම දිය යුතු කොන්දේසි ; සහ

(එ) අවශ්‍ය විය හැකි වෙනත් යම් විස්තර.

(2) ගිවිසුම (පුහුණුවීමේ සේවායෝජක යනුවෙන් සඳහන් කරනු ලබන) සේවායෝජකයා විසින් සහ පුහුණුවන්නා විසින් අත්සන් කළ යුතු අතර පුහුණුවන්නා වැඩිහිටියෙකු නොවන අවස්ථාවක ඔහුගේ නෛතික නියෝජිතයා විසින් අත්සන් කළ යුතු ය.

(3) ගිවිසුම අත්සන් කිරීමෙන් ඉක්බිතිවම පුහුණුවීමේ සේවා යෝජකයා විසින් එසේ අත්සන් කරන ලද ගිවිසුමේ පිටපතක් අවස්ථාවෝචිත පරිදි පුහුණුවන්නාට හෝ ඔහුගේ නෛතික නියෝජිතයාට දිය යුතු ය.

(4) (2) සහ (3) වන උපවගන්තිවල විධිවිධාන සාදනු ලැබිය හැකි කිසියම් සංශෝධනවලට සහ ඒවා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

66. (1) මූලික පුහුණුවීමේ කාලසීමාවක් පරිවාස කාලසීමාවක් සමග ආරම්භ විය යුතු අතර ගිවිසුමේ නිශ්චිතව සඳහන් කර ඇති පුහුණුවීමේ කාලසීමාව ඉකුත් වන විට අවසන් විය යුතු ය : — මූලික පුහුණුවේ කාලසීමාව.

එසේ වුවද, පුහුණුවන්නකු විසින් සිය අවසාන පරීක්ෂණය ඔහුගේ පුහුණුවීමේ කාලසීමාව ඉකුත්වීමට මත්තෙන් සමර්ථ වී සිටින අවස්ථාවක ඔහුගේ මූලික පුහුණු කාලසීමාව සිය පරීක්ෂණය සමර්ථ වන විට අවසන් විය යුතු ය.

(2) පුහුණුවන්නකු සිය අවසාන පරීක්ෂණය අසමර්ථ වූ අවස්ථාවක ඔහු විසින් ඉල්ලා සිටිනු ලබන්නේ නම් ඔහුගේ ගිවිසුම එක් අවුරුද්දක උපරිම කාලයකට යටත්ව, ඔහු සිය විභාගය සඳහා ඊළඟට පෙනී සිටින අවස්ථාව තෙක් දීර්ඝ කරනු ලැබිය යුතු ය.

67. (1) පුහුණුවීමේ සේවායෝජකයකු විසින් පුහුණුවන්නකු සමග ගිවිසුමකට ඇතුලත්වීම අවසන් කළ වහාම ඒ ගිවිසුම් ලේඛණයේ ඇතුලත් කිරීම පිණිස ඔහු විසින් අධිකාරියට ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය. ඒ ඉල්ලීමට ගිවිසුමේ පිටපතක් අමුණා තිබිය යුතු ය. ගිවිසුමේ අත්‍යාවශ්‍ය නියමයන් සංශෝධනය කළ අවස්ථාවක අවශ්‍ය වෙනස් කිරීම් සහිතව මෙය අදාළ විය යුතු ය. — ගිවිසුම් ලියාපදිංචි කිරීම.

(2) සෑම පුහුණුවීමේ සේවායෝජකයකු විසින්ම—

(අ) පුහුණුවන්නා විසින් කලින් ලබා ඇති වෘත්තීය පුහුණුවට අදාළ හෝ ඒ හා සම්බන්ධව හෝ පුහුණුවීම් ඇත්නම් ඒ පුහුණුවීම් ද,

(ආ) පුහුණු කරවීමේ නිලධාරීන් පත් කිරීම ගැන ද අධිකාරියට දන්වීමක් කළ යුතු ය.

68. (1) අධිකාරිය සුදුසුයයි සලකන අවස්ථාවක සහ තිබෙන සේවා නියුක්ති අවස්ථා සැලකිල්ලට ගෙන අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව එක් එක් පුහුණු වෘත්තීන් සම්බන්ධයෙන් ලියාපදිංචි කළ හැකි උපරිම ගිවිසුම් සංඛ්‍යාව නිශ්චය කරමින් අධිකාරිය විසින් නියමයක් කරනු ලැබ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය. — අධිකාරිය විසින් උපරිම ගිවිසුම් සංඛ්‍යාව නිශ්චය කළයුතු බව.

(2) පුහුණුවන්නකු සමග ගිවිසුමකට එළඹීමට අදහස් කරන යම් සේවායෝජකයකු විසින් ඒ ගිවිසුමට ඇතුළත් වීමට ප්‍රථම, ඒ විශේෂ පුහුණු වෘත්තීන් සම්බන්ධයෙන් වූ උපරිම ගිවිසුම් සංඛ්‍යාව අධිකාරිය සමග ලියාපදිංචි කරනු ලැබ ඇත්දැයි විමසා බැලිය යුතු ය.

(3) අවස්ථාවෝචිත පරිදි, සේවායෝජකයකු වන්නා වූ හෝ පුහුණුවන්නකු වශයෙන් පුහුණුවීමට කැමැති තැනැත්තකු වන්නා වූ යම් අතෘප්තියට පත් පාර්ශ්වයක් විසින් අමාත්‍යවරයා වෙත අභියාචනයක් කළ හැකි අතර ඒ අභියාචනය මත අමාත්‍යවරයා විසින් (1) උපවගන්තිය සම්බන්ධයෙන් අධිකාරිය විසින් කරන ලද තීරණයක සංශෝධනය කිරීම හෝ ඉවත් කිරීම කරනු ලැබිය හැකි ය.

සංශෝධනය ඇතුළත් කිරීම හා අත් හැර දැමීම.

**69.** (1) (අ) ගිවිසුමෙන් මේ පනතේ මේ කොටසේ විධිවිධාන සහ ඒ යටතේ සාදන ලද නියෝග ඉටු වන්නේ නම්; සහ

(ආ) පුහුණු කරන සේවායෝජකයාට අවශ්‍ය පිරිස් හා කාර්මික පහසුකම් ඇත්තේ නම් සහ පුහුණුවීමේ ස්ථානය පුහුණුවන්නන් යෙදවීම සඳහා සහ ඔහුගේ පුහුණුවේ විධිවිධාන සඳහා සුදුසු නම්

සෑම ගිවිසුමක්ම සහ එහි අත්‍යාවශ්‍ය නියමයන්ගේ සෑම සංශෝධනයක්ම ලේඛනයෙහි ඇතුළත් කළ යුතු ය.

(2) මෙහි මීට ඉහතින් නිශ්චිතව දක්වා ඇති විධිවිධානවල නිශ්චිතව දක්වා ඇති කොන්දේසි ඉටු නොකරන ලද හා 70 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි අඩුපාඩුවලට පිළියම් නොයෙදූ අවස්ථාවක අධිකාරිය විසින් ගිවිසුමක් ලේඛනයෙහි ඇතුළත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

අඩුපාඩු දක්නට ලැබෙන අය සඳහා අධිකාරිය විසින් පිළියම් නියම කිරීම.

**70.** පුහුණුවන්නන්ට මූලික පුහුණුව සැලැස්වීම පිණිස යම් සේවායෝජකයකුගේ යෝග්‍යතාවය සම්බන්ධයෙන් ඇති අඩුපාඩු සොයාගනු ලැබූ සහ පුහුණුවන්නන්ට යම් හානියක් සිදුනොවන පිළියමක් ඇති බව සොයාගනු ලැබූ අවස්ථාවක, අධිකාරිය විසින් නියම කරනු ලැබිය හැකි කාලයක් ඇතුළත ඒ පිළියම් අදාළ කරගන්නා ලෙස ඒ සේවායෝජකයාට අධිකාරිය විසින් නියම කරනු ලැබිය යුතු ය.

පරිවාස කාලසීමාවේදී දැන් වීමක් නොකර අවසන් කිරීම.

**71.** පරිවාස කාලසීමාව තුළදී ඕනෑම වේලාවක දැන්වීමක් නොකර මූලික පුහුණුවීමේ කාලසීමාව අවසන් කරනු ලැබිය හැකි ය.

අවසන් කිරීමේ දැන් වීම.

**72.** (1) අධිකාරිය වෙත අවසන් කිරීම සඳහා වූ ඉල්ලීමක් කරනු ලැබ ඇත්නම් පමණක් සහ අධිකාරිය විසින් ඒ ඉල්ලීමට ඉඩ දෙනු ලැබ ඇත්නම් පරිවාස කාලසීමාව ඉකුත්වීමෙන් පසු ගිවිසුමක් අවසන් කරනු ලැබිය හැකි ය.

(2) එවැනි ඉල්ලීමක් කිරීම සඳහා ඈග එවැනි ඉල්ලීමක් වෙනුවෙන් වූ යම් විභාගයක් පැවැත්වීම සඳහා ක්‍රියා පරිපාටිය ද එවැනි ඉල්ලීමකට ඉඩදීම සඳහා ඇති හේතූන් ද නියම කර ඇති පරිදි විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරන ලද ගිවිසුමක්, ඒ ගිවිසුමේ නියමයන් හා කොන්දේසි ඉටුකිරීමට ඒ ගිවිසුමේ එක් පාර්ශ්වයක් අපොහොසත්වීමේ හේතුව උඩ, අවසන් කිරීම පිණිස වූ ඉල්ලීමකට ඉඩ දෙමින් අධිකාරිය විසින් නියමයක් කරන ලද අවස්ථාවක—

(අ) ඒ පාර්ශ්වය පුහුණු කරවන සේවායෝජකයා නම් ඒ සේවායෝජකයා විසින් පුහුණුවන්නාට අධිකාරිය විසින් තීරණය කරනු ලබන වන්දියක් ගෙවිය යුතුය;

(ආ) ඒ පාර්ශ්වය පුහුණුවන්නා නම්, ඔහු විසින් ඒ මූලික පුහුණුවේ වියදම් වශයෙන් අධිකාරිය විසින් තීරණය කරනු ලබන මුදලක් ඒ පුහුණුකරවන සේවායෝජකයාට

ගෙවිය යුතු ය.

(4) අධිකාරියේ තීරණයෙන් අතෘප්තියට පත් යම් පාර්ශවයක් විසින් ඒ තීරණයට විරුද්ධව අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාට අභියාචනය කළ හැකි ය.

73. එක් එක් ගිවිසුමේ අත්‍යාවශ්‍ය නියමයන් සටහන් කර තැබිය යුතු මූලික පුහුණු ගිවිසුම් පිළිබඳ ලේඛනයක් අධිකාරිය විසින් පවත්වාගෙන යා යුතු ය. මූලික පුහුණු ගිවිසුම පිළිබඳ ලේඛනය.

74. (1) ආධුනිකයකුගේ මූලික පුහුණුවේ කාලසීමාව අවසානයෙන් පසු තමාට පුහුණු වෘත්තියක් සොයා ගැනීම පරිසීමා කෙරෙන යම් එකඟවීමක් හෝ ගිවිසුමක් බල රහිත විය යුතුය : අවලංගු ගිවිසුම.

එසේ වුවද, ඒ පුහුණුවන්නා, ගිවිසුමේ අවසාන මාස තුන ඇතුළතදී—

(අ) ගිවිසුමේ නියම කර ඇති මූලික පුහුණුවේ කාලසීමාව අවසාන වීමෙන් පසුව නිශ්චිතව සඳහන් නොකළ කාලසීමාවක් සඳහා පුහුණු කරවන සේවායෝජකයා සමග සේවානියුක්ති සම්බන්ධතාවයක පාර්ශ්වකරුවකු වී සිටිමට ; සහ

(ආ) මූලික පුහුණුවේ කාලසීමාව ඉකුත්වීමෙන් පසු පුහුණුවන්නාට මූලික පුහුණුවේ අවශ්‍යාංගවලට පරිබාහිරව අතිරේක උප දෙස් සලස්වාලීමේ වියදම් පුහුණු කරවන සේවායෝජකයා විසින් දරනු ලබන සහ ඒ වියදම, එසේ පාර්ශ්වකරුවකු වී සිටින කාලසීමාව සමග සමාන වන අවස්ථාවක අවුරුදු පහක කාලයකට නොවැඩි කාලසීමාවක් සඳහා පුහුණු කරවන සේවායෝජකයා සමග සේවානියුක්ති සම්බන්ධතාවයකට පාර්ශ්වකරුවකු වී සිටීමට ඔහු විසින්ම එකඟවීමෙන් සිදු කර ඇත්තේ නම් යම් පුහුණුවන්නකු සහ පුහුණු කරවන සේවායෝජකයකු විසින් ඇතුළත් වී ඇති යම් එකඟවීම කට මෙම විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(2) (අ) සිය මූලික පුහුණුව සඳහා පුහුණුවන්නාට ගෙවීම් කිරීමට බැඳීමක් පනවන්නා වූ ද ;

(ආ) ගිවිසුමේ ඇතුළත් කළ යුතු දණ්ඩන පනවන්නා වූ ද ;

(ඇ) හානි සඳහා වන්දි ලබා ගැනීම පිණිස වූ ඉල්ලීම්වල යම් බැහැර කිරීම් හෝ සීමාකිරීම් පනවන්නා වූ ද ;

(ඈ) හානි සඳහා එක්වර ගෙවීමක් ලෙස වන්දිවල ප්‍රමාණය නිශ්චනය කරන්නා වූ ද

ගිවිසුමෙන් පරිබාහිර යම් එකඟවීමක් බලරහිත විය යුතු ය.

(3) මේ පනතේ මේ කොටසේ විධිවිධාන ඉටු නොකර ඇතුළත් වන යම් ගිවිසුමක් හෝ එකඟවීමක් බලරහිත විය යුතු ය.

75. (1) පුහුණු කරවන සේවායෝජකයකු විසින්— පුහුණු කරවන සේවායෝජකයකුගේ කාර්ය.

(අ) පුහුණුවේ පරමාර්ථය නියම කරන ලද කාලය ඇතුළත ලබා ගැනීමට හැකිවන පරිදි, තත් කාර්යය සඳහා අධිකාරිය විසින් නිකුත් කර ඇති පුහුණු කිරීමේ නියමයන්ට අනු

කුලව සිය පුහුණුවේ කාර්යය පුහුණුවන්නාට ලබාගත හැකි වීම පිණිස අවශ්‍ය පුහුණුවීම් හා දැනුම ඔහුට ලබාදීම සහතික කළ යුතුය ;

(ආ) ඔහු විසින් පුහුණුව දීම හෝ ඒ කාර්යය සඳහා සුදුසු යයි ඔහු විසින් තීරණය කරන යම් නිලධාරියකුට එය ප්‍රකාශිතවම භාර කිරීම කළ යුතුය ;

(ඇ) සිය පුහුණුව සඳහා සහ සිය අන්තර් සහ අවසාන පරීක්ෂණ සමත්වීම සඳහා, ඒ පරීක්ෂණ මූලික පුහුණුවේ කාලසීමාව අවසන් වීමෙන් පසු පැවැත්වෙන්නේ වුවද, අවශ්‍ය කරන ආවුද සහ ද්‍රව්‍ය වැනි අවශ්‍ය භාණ්ඩ පුහුණුවන්නාට සපයා දිය යුතු ය.

(2) පුහුණු කරවන සේවායෝජකයකු විසින් පුහුණුවන්නකුට සිය අධ්‍යයන කටයුතු කරගෙන යාමට සහ ඔහුගේ පරීක්ෂණවලට පෙනී සිටීම සඳහා අවශ්‍ය කරන කාලය සඳහා ඉඩ දිය යුතු ය.

(3) මේ වගන්තියේ විධිවිධාන, පුහුණුවීමේ ස්ථානයෙන් පිටත දී පුහුණුවීමේ වැඩසටහන් අනුගමනය කළ යුතුව ඇති අවස්ථාවලදී ද අදාළ විය යුතු ය.

පුහුණුවන්නකුගේ කාර්යයන්.

76. සිය පුහුණුවේ කාර්යය ළඟා කර ගැනීම සඳහා තමාට අවශ්‍ය නිපුණත්වය සහ දැනුම අත්පත් කර ගැනීමට පුහුණුවන්නකු විසින් සෑම ප්‍රයත්නයක්ම දැරිය යුතු ය.

විශේෂයෙන් ම, ඔහු විසින්—

(අ) සිය පුහුණුවේ කොටසක් වශයෙන් ඔහුට පවරනු ලැබූ වැඩ පරෙස්සමින් ඉටුකළ යුතු ය ;

(ආ) පුහුණුවීමේ වැඩසටහන් සඳහා 75 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ඔහුට ලබා දී ඇති වැඩ නොකරන වේලාවන් තුළ දී ඒ පුහුණුවීමේ වැඩසටහන්වලට සහභාගී විය යුතු ය ;

(ඇ) පුහුණු කරවන සේවායෝජකයා විසින් හෝ තමාට එවැනි උපදෙස් දීමට හිමිකම් ඇති යම් පුහුණු කරවන නිලධරයකු විසින් හෝ තමාගේ පුහුණුවේ කොටසක් ලෙස ඔහුට දෙනු ලබන උපදෙස් ඉටු කළ යුතු ය ;

(ඈ) පුහුණුවීමේ ස්ථානයේ පිළිපදින හැසිරීම පිළිබඳ රීතිවලට සැලකිල්ල දැක්විය යුතු ය ;

(ඉ) නිසි පරෙස්සම ඇතිව, ආවුද, යන්ත්‍රෝපකරණ හා වෙනත් සවිකර ඇති යන්ත්‍ර භාවිතා කළ යුතු ය ; තවද

(ඊ) කිසියම් ව්‍යාපාරික හෝ වෙළෙඳ රහසක් අනාවරණය නොකළ යුතු ය.

පුහුණුව කරවීමේ ආයතන සම්බන්ධයෙන් අධිකාරියේ බලතල.

77. පුහුණු කරවීමේ ආයතනවල ස්වභාවය, සංඛ්‍යාව, විශාලත්වයේ ප්‍රමාණය සහ පිහිටීම ගුණාත්මකව සහ ප්‍රමාණාත්මකව ප්‍රමාණවත් වෘත්තීය පුහුණුවීමේ ස්ථාන සංඛ්‍යාවක් සහතික කරන බවද, අනාගතයේදී බලාපොරොත්තු වන පුහුණුවීමේ මධ්‍යස්ථාන සඳහා වූ ඉල්ලීම් ගැන නිසි සැලකිල්ල දක්වමින්, ඒ පුහුණුවීමේ ආයතනවලින් ප්‍රශස්ත ප්‍රයෝජනය ලබාගන්නා බව ද අධිකාරිය විසින් සහතික කළ යුතු ය.

78. (1) අධිකාරිය විසින් පුහුණුවීමේ ස්ථාන සංවර්ධනය පිළිබඳව පරීක්ෂාකර බලා එක් එක් වර්ෂයේ මාර්තු 31 වන දින වන විට කොමිෂන් සභාවට සහ අමාත්‍යවරයාට වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය. ඉදිරි වර්ෂ තුළ දී පුහුණුවීමේ ස්ථාන සැපයීම පිළිබඳව ඇති විය හැකි තවදුරටත් වූ වර්ධනය ඒ වාර්තාවෙන් විස්තර කළ යුතු අතර, පුහුණුවීමේ ස්ථාන පිළිබඳ සමබර සැපයුම අවදානමට වැටී තිබෙන බවට ලකුණු ඇති අවස්ථාවක, එවැනි තත්වයකට පිළියම් යෙදීම සඳහා වූ යෝජනා ද වාර්තාවට ඇතුළත් විය යුතු ය. වෘත්තීය පුහුණු වාර්තාව.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද වාර්තාවේ පහත දැක්වෙන විස්තර ද ඇතුළත් විය යුතු ය :—

(අ) පෙරාතුවම වූ ලින් වර්ෂය සඳහා—

(i) පෙරාතුවම වූ මාස දොළහ තුළ අවසන් කරන ලද පුහුණුවීමේ ගිවිසුම් ;

(ii) පිරවීමට නොයෙදුනු පුහුණුවීමේ ස්ථාන සංඛ්‍යාව සහ පුහුණුවීමේ ස්ථාන අපේක්ෂාවෙන එවකට අධිකාරියෙහි ලියාපදිංචි වී ඇති තැනැත්තන් සංඛ්‍යාව ;

(ආ) පවත්නා ලින් වර්ෂය සඳහා—

(i) පුහුණුවීමේ ස්ථාන අපේක්ෂා කරනු ඇතැයි බලාපොරොත්තු වන තැනැත්තන් සංඛ්‍යාව ; සහ

(ii) සමාලෝචනයට භාජනය වන වර්ෂයේ සැප්තැම්බර් තිස්වන දිනට පිරිනැමීමට තිබිය යුතු යයි බලාපොරොත්තු වන පුහුණුවීමේ ස්ථාන සංඛ්‍යාව.

79. (1) (අ) පුහුණු කිරීමේ ස්ථානයේ ස්වභාවය හා එහි ඇති උපකරණ මූලික පුහුණුවට යෝග්‍ය නම් ; සහ කවුරුන් විසින් පුහුණු වන්නන් යොදවා ගත හැකිද යන වග.

(ආ) පුහුණුවන්නන් හා පුහුණු පුරප්පාඩු හෝ තම සේවයේ නියුතු පුහුණු කාර්ය මණ්ඩලය අතර අනුපාතය (ඒ අනුපාතය පුහුණුවට අහිතකර නොවන්නේ නම් මිස) ගැළපේ නම්

මිස, කිසිදු සේවායෝජකයකු විසින් යම් තැනැත්තකු පුහුණුවන්නකු ලෙස යොදවා නොගත යුතු ය.

(2) අවශ්‍ය කරන දැනුම සහ දක්ෂතා මුළුමනින්ම සපයා දිය නොහැකි පුහුණු කිරීමේ ස්ථාන, ස්ථානයෙන් පිටත පවත්වන පුහුණුවීමේ වැඩසටහන් මගින් අඩුපාඩුවලට පිළියම් යෙදිය හැකි නම්, සුදුසු පුහුණු කිරීමේ ස්ථාන ලෙස සලකනු ලැබිය යුතු ය.

80. (1) වැඩිදුරටත් වූ පුහුණුව, තැනැත්තකුට ස්වකීය වෘත්තීය පුහුණුව සහ දක්ෂතා පවත්වා ගැනීමට හෝ පුළුල් කර ගැනීමට හැකිවනු පිණිස ද කාර්මික වර්ධනයට ඔහු විසින් ම උපයෝගී කර ගැනීමට හැකිවනු පිණිස හෝ ඔහු විසින් ඇතටමත් මූලික පුහුණුව ලබාගෙන ඇති පුහුණුවෙන් කරන වෘත්තීයක යම් ක්ෂේත්‍රයක උසස්වීමක් ලබාගැනීමට හැකිවනු පිණිස ද සැලසුම් කළ යුතු ය. වැඩිදුරටත් වූ පුහුණුව සඳහා යෝජනා ක්‍රම.

(2) සංවර්ධන සැලැස්මේ සලස්වා ඇති මාර්ගෝපදේශවලට අනුව වැඩිදුරටත් වූ පුහුණුව සඳහා අධිකාරිය විසින් යෝජනා ක්‍රම සකස් කළ හැකි ය.

(3) අධිකාරිය විසින් ආයතනය විමසා එහි සේවා නියුක්තයන් වෙනුවෙන්, වැඩිදුරටත් වූ පුහුණුව සඳහා ඉල්ලුම් කර සිටිය හැකි අතර. ඒ පරීක්ෂණ පැවැත්වීමේ විෂය කරුණු, සම්මතයන්, ක්‍රියා පටිපාටිය සහ ඒවා පැවැත්වීම නිගමනය කළ යුතු ය; තවද ඒ කාර්යය සඳහා පරීක්ෂක මණ්ඩල එය විසින් පත් කළ යුතු ය.

(4) වැඩිදුරටත් වූ පුහුණුවේ ප්‍රතිඵල වශයෙන් අත්කරගත් දැනුම, නිපුණත්වය සහ පළපුරුද්ද පරීක්ෂාකර බැලීම පිණිස අධිකාරිය විසින් පරීක්ෂණ පැවැත්විය හැකිය ; නැතහොත් එසේ පවත්වන ලෙස වෙනත් නියෝජ්‍යායතනවලට බලය පැවරිය හැකි ය.

නැවත පුහුණු කිරීමේ වැඩ සටහන්.

81. (1) නැවත පුහුණු කිරීම, මගින් තැනැත්තකු දැනටමත් මූලික පුහුණුවක් ලබා ඇති පුහුණුවෙන් කරන වෘත්තියක් හැර වෙනත් යම් පුහුණුවෙන් කරන වෘත්තියක් සඳහා ඔහුට සුදුසුකම් ලැබීම පිණිස සැලසුම් කළ යුතු ය.

(2) නැවත පුහුණු කිරීමේ යෝජනා ක්‍රම, එහි විෂය කරුණු, ස්වභාවය, කාර්යය සහ කාලසීමාව සම්බන්ධයෙන්, යම් වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයකට අදාළ විශේෂ අවශ්‍යතාවලට සමාන ප්‍රමාණයෙන් විය යුතු ය.

(3) සෑම නැවත පුහුණු කිරීමේ යෝජනා ක්‍රමයක් ම, ඒ සඳහා සංවර්ධන සැලැස්මේ ඉඩ සලස්වා ඇති මාර්ගෝපදේශවලට අනුකූල විය යුතු ය.

(4) අධිකාරිය විසින් ඒ පරීක්ෂණවල විෂය කරුණු, කාර්යය, සම්මතයන්, ක්‍රියා පටිපාටිය සහ ඒවාට ඇතුළත් කරගැනීමේ කොන්දේසි තීරණය කිරීම සහ පරීක්ෂක මණ්ඩල පත් කිරීම කළ යුතු ය.

(5) නැවත පුහුණු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස අත්කරගත් දැනුම, නිපුණත්වය සහ පළපුරුද්ද පරීක්ෂාකර බැලීම සඳහා අධිකාරිය විසින් පරීක්ෂණ පැවැත්විය යුතු ය. ඒ පරීක්ෂණ අදාළ වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයකට අදාළ වූ විශේෂ අවශ්‍යතාවලට සමාන විය යුතු ය.

ජාතික වෘත්තීය පරීක්ෂණ ඇතිකිරීම.

82. (1) යම් සංවර්ධන සැලැස්මකට අනුව ජාතික වෘත්තීය පරීක්ෂණ පැවැත්වීමට අධිකාරියට බලය තිබිය යුතු ය.

(2) ජාතික වෘත්තීය පරීක්ෂණ අධිකාරිය විසින් පැවැත්විය යුතුය; නැතහොත් ඒ ජාතික වෘත්තීය පරීක්ෂණ සංස්ථාවේ විධාන යටතේ පැවැත්වීමට වෙනත් යම් නියෝජ්‍යායතනයකට බලය දිය යුතු ය.

(3) සංවර්ධන සැලැස්මට අනුකූලව සහ කොමිෂන් සභාවේ විධානවලට හා පාලනයට යටත්ව, වෘත්තීය පරීක්ෂණ සාර්ථක ලෙස සම්පූර්ණ කරන සහ විශේෂ වෘත්තියක අවශ්‍ය නිපුණත්වය හා ප්‍රවීනතාවය අත්කර ගන්නා අයට සහතික පත්‍ර නිකුත් කිරීම සඳහා අධිකාරිය විසින් යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කළ යුතු ය.

**83.** (1) (2) වන උපවගන්තිය යටතේ කරනු ලබන යම් පුහුණු වීමේ අයකිරීම් නියමයක විශේෂයෙන් සඳහන් කර ඇති සෑම ආයතනයක් වෙනුවෙන් ම එක් එක් වර්ෂය සඳහා සෙස් බද්දක් අය කරනු ලැබීම හා ගෙවීම කළ යුතු ය. පුහුණුවීම් සෙස් බද්ද.

(2) අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, පුහුණුවීමේ අයකිරීම් නියමයක් කරනු ලැබිය හැකි ය. ඒ නියමය ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

(3) පුහුණුවීමේ අයකිරීම් නියමයෙහි—

(අ) සෙස් බද්දේ ගාස්තු ප්‍රමාණය හෝ මුදල ;

(ආ) ඒ සෙස් බද්ද ගෙවීමට යටත් ආයතන ;

(ඇ) නියමිත ගෙවීමේ ආකාරය ;

(ඈ) නියමිත ගෙවීමේ දිනය ; සහ

(ඉ) ඒ සෙස් බද්ද එකතු කිරීමට බලයලත් තැනැත්තා හෝ ආයතනය

නිශ්චිතව සඳහන් විය යුතු ය.

(4) සෙස් බද්දට යටත් යම් ආයතනයක් වෙනුවෙන් අයවිය යුතු යම් වර්ෂයක් සඳහා වූ පුහුණුවීමේ සෙස් බද්ද අධිකාරියට නොගෙවූ අවස්ථාවක, අධිකාරිය විසින්, සෙස් බද්දෙන් සියයට පහළොවකට වැඩි නොවූ මුදලක් අධිකාරියේ අභිමතය පරිදි, සෙස් බද්දට එකතු කොට අයකරගනු ලැබිය හැකි ය. එසේ එකතු කරන ලද යම් මුදලක් සෙස් බද්දේ කොටසක් ලෙස සැලකිය යුතු ය.

(5) සෙස් බද්දට යටත් යම් ආයතනයක් වෙනුවෙන් අයවිය යුතු යම් වර්ෂයක් සඳහා වූ පුහුණුවීමේ සෙස් බද්ද අධිකාරියට නොගෙවූ අවස්ථාවක, අධිකාරිය විසින් ඒ සෙස් බද්ද, රජයට අයවිය යුතු ණයක් අයකර ගන්නා ආකාරයට අයකර ගත යුතු ය.

(6) එවැනි නියමයක් සම්බන්ධයෙන්, 96 වන වගන්තියේ (2) වන හා (3) වන උපවගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

**84.** (1) සෑම සේවායෝජකයකු විසින්ම, සිය ආයතනයේ වෘත්තීය පුහුණු ලබමින් සිටින එක් එක් පුහුණුවන්නාගේ පුහුණුවේ ප්‍රගතිය පිළිබඳව නියම කරනු ලැබ ඇති ආකෘතිවල වාර්තා තබාගත යුතු ය. සේවායෝජකයා විසින් ප්‍රගතිය පිළිබඳ වාර්තා පවත්වාගත යුතු බව.

(2) සෑම සේවායෝජකයකු විසින්ම, සිය ආයතනයේ පුහුණුව ලබමින් සිටින පුහුණුවන්නන් වෙනුවෙන්, නියම කරනු ලැබිය හැකි ආකෘතිවල සහ කාලසීමාවන් අතරතුර දී, එවැනි තොරතුරු සහ වාර වාර්තා අධිකාරිය වෙත සැපයිය යුතු ය.

**85.** අධිකාරිය විසින්, නියම කරනු ලැබ ඇති ආකෘතිවල, අවශ්‍ය විය හැකි වාර්තා පවත්වාගෙන යා යුතු ය. අධිකාරියේ වාර්තා.

ශිෂ්‍යත්වවල බන්ධනකාරී බලපෑම.

**86.** මේ පනත උල්ලංඝනය කිරීමක් සිදු කිරීමට පුහුණුවීමේ ගිවිසුමක යම් පාර්ශවකරුවකු පොළඹවන හෝ මෙහෙයවන යම් තැනැත්තෙක් ද එවැනි උල්ලංඝනය කිරීමකට අන්‍යාකාරයෙන් පොළඹවන, ප්‍රරෝචනය කරන, ආධාර කරන හෝ අනුබල දෙන තැනැත්තෙක් ද මේ පනත යටතේ වරදක් කරන්නේ ය.

අධිකාරියේ සාමාජිකයකුට විරුද්ධව පුද්ගලිකව හෝ ඔහුගේ දේපළට විරුද්ධව රිට් ආඥා නිකුත් කළ නොහැකි බව.

**87.** අධිකාරියට විරුද්ධව පවරනු ලැබිය හැකි කවර හෝ නඩුව කදී අධිකාරියේ සාමාජිකයකුට විරුද්ධව පුද්ගලිකව හෝ ඔහුගේ දේපළවලට විරුද්ධව රිට් ආඥා නිකුත් නොකළ යුතු ය.

අධිකාරියේ නිලධරයන් හා සේවකයන් රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.

**88.** අධිකාරියේ සියලුම නිලධරයන් සහ සේවකයන්, දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථය ඇතුළත සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ සහ අධිකාරියේ විධානය මත ගන්නා ලද ක්‍රියා සඳහා ආරක්ෂාව.

**89.** (1) (අ) මේ පනත යටතේ අධිකාරිය විසින් යහපත් අදහසින් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරන ලද හෝ ක්‍රියාවක් සඳහා අධිකාරියට විරුද්ධව නඩු පැවරීමක් සිදු නොවිය යුතුය; හෝ

(ආ) අධිකාරියේ යම් සාමාජිකයකු, නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් මේ පනත යටතේ හෝ අධිකාරියේ විධිවිධාන යටතේ සද්භාවයෙන් කරන ලද්දා වූ හෝ කරන ලද්දේ යයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සඳහා ඒ සාමාජිකයාට, නිලධරයාට, සේවකයාට හෝ අනුයෝජිතයාට විරුද්ධව

නඩු පැවරීමක් සිදු නොවිය යුතුය.

(2) යම් අධිකරණයක් ඉදිරියේ අධිකාරිය විසින් පවරන ලද්දා වූ හෝ ඊට විරුද්ධව පවරනු ලැබුවා වූ යම් නඩුවක දී අධිකාරිය විසින් දරන ලද යම් වියදමක් අධිකාරියේ අරමුදල්වලින් ගෙවිය යුතු ය. තවද එවැනි යම් නඩුවකදී අධිකාරියට ගෙවන ලද හෝ අයකර ගන්නා ලද යම් නඩු ගාස්තුවක් අධිකාරියේ අරමුදල්වලට බැර කළ යුතුය.

(3) මේ පනත යටතේ හෝ අධිකාරියේ විධානය පිට හෝ ඔහු විසින් කරන ලද හෝ කරන ලදැයි අදහස් කෙරෙන යම් ක්‍රියාවක් වෙනුවෙන් යම් අධිකරණයක් හමුවේ ඔහුට විරුද්ධව ගෙනෙන ලද යම් නඩුවකදී (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් කරන ලද පරිදි එවැනි යම් තැනැත්තකු විසින් දරන ලද යම්

වියදම්, ඒ වියදම ඒ හාබුවේදී, ඔහු විසින් අයකර ගෙන ඇත්තේ නම් මිස, අධිකරණය විසින් තීරණය කරන්නේ නම් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

90 (1) යම් පුහුණු කරවන සේවායෝජකයකු විසින්—

පුහුණු කරවන සේවා යෝජකයකු විසින් කරනු ලබන වරදවල්.

(අ) පුහුණුවන්නකු වශයෙන් යොදවා ගැනීම පිණිස සුදුසුකම් නොමැති යම් තැනැත්තකු පුහුණුවන්නකු ලෙස යොදවා ගන්නේ නම්;

(ආ) පුහුණුවීමේ ගිවිසුමක නියමයන් හා කොන්දේසි ඉටු කිරීම පැහැර හරින්නේ නම්; හෝ

(ඇ) මේ පනතේ විධිවිධාන යටතේ ඔහු විසින් යොදවා ගත යුතු බවට නියම කර ඇති පුහුණුවන්නන් සංඛ්‍යාවට අදාළ ඒ විධිවිධාන උල්ලංඝනය කරන්නේ නම්

ඒ පුහුණුකරවන සේවායෝජකයා මේ පනත යටතේ වරදකට වරද කරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගය කින් වරදකරු කිරීමෙන් පසු රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය.

(2) යම් පුහුණු කරවන සේවායෝජකයකු හෝ වෙනත් යම් තැනැත්තකු විසින්—

(අ) යම් තොරතුරක් හෝ වාර වාර්තාවක් සපයන ලෙස ඔහුට නියම කරනු ලැබූ විට—

(i) ඒ තොරතුරු හෝ වාර වාර්තාව සැපයීම ප්‍රතික්ෂේප කළහොත් හෝ අතපසු කළහොත්; හෝ

(ii) අසත්‍ය සහ එය අසත්‍ය බව තමා දන්නා හෝ විශ්වාස කරන හෝ සත්‍ය බව තමා විශ්වාස නොකරන යම් තොරතුරක් හෝ වාර වාර්තාවක් සැපයුවහොත් හෝ සැපයීමට සැලැස්වුවහොත්; හෝ

(iii) ඔහුට සැපයීමට නියම කරන ලද යම් තොරතුරක් ලබාගැනීම පිණිස අවශ්‍ය යම් ප්‍රශ්නයකට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කළහොත් හෝ ඊට අසත්‍ය පිළිතුරක් දුනහොත්;

(ආ) මේ පනතින් හෝ ඒ යටතේ බලය දෙන ලද යම් සටහනක්, පරීක්ෂණයක්, විභාගයක් හෝ විභාග කිරීමක් කිරීම සඳහා අධිකාරිය විසින් නිසි පරිදි බලය පවරන ලද වෙනත් යම් නිලධරයකුට යම් සාධාරණ පහසුකම් සැපයීම ප්‍රතික්ෂේප කළහොත් හෝ ඕනෑකමින්ම අතපසු කළහොත්;

(ඇ) මූලික පුහුණුව පිළිබඳ ගිවිසුමේ විධිවිධාන සලසා ඇති පරිදි අනුමතිය ලබා නොගෙන පුහුණුවන්නකුට අතිකාල වැඩ කිරීමට නියම කළහොත්;

(ඈ) ස්වකීය පුහුණුවට සම්බන්ධ නොවූ යම් කාර්යයක පුහුණු වන්නකු සේවයෙහි නියුක්ත කළහොත් ;

(ඉ) අසත්‍ය ලෙස පරීක්ෂකයකුගේ තත්ත්වය දරා සිටියහොත් ;

(ඊ) එහි යම් වැදගත් වන විස්තරයක් අසත්‍යවන්නා වූ ද, එය අසත්‍ය බව තමා විසින් දැන සිටියාවූ ද ප්‍රකාශයක් පරීක්ෂකවරයකුට කළහොත් ;

(උ) පරීක්ෂකවරයකු විසින් දෙන ලද යම් නීත්‍යානුකූල විධාන යක් ඉටු කිරීම ප්‍රතික්ෂේප කළහොත් හෝ පැහැර හැරියහොත් ;

(ඌ) සිය බලතල හෝ කාර්ය ක්‍රියාත්මක කිරීමේදී පරීක්ෂකවර යකුට අවහිර කළහොත් හෝ බාධා කළහොත් ; හෝ

(එ) දණ්ඩන ගෙවන ලෙස කරනු ලබන යම් ඉල්ලීමක් ඉටු නොකළහොත්

ඒ පුහුණු කරවන සේවායෝජකයා හෝ වෙනත් තැනැත්තා මේ පනත යටතේ වූ වරදකට වරදකරු විය යුතු අතර, මහේස්ත්‍රාත් වරයකු හමුවෙහි වූ ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබී මෙන් පසු රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාර යක බන්ධනාගාරගත කිරීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය.

සාමාන්‍ය දණ්ඩන.

**91.** මේ පනතේ වෙනත් දඬුවමක් ප්‍රකාශිතවම සලස්වා නොමැති, මේ පනතේ මේ කොටස යටතේ වූ වරදක් සඳහා වරද කරුවකු වන යම් තැනැත්තකු, මහේස්ත්‍රාත්වරයකු හමුවෙහි ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබීමෙන් පසු රුපියල් දහදාහ කට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

පුද්ගල මණ්ඩල විසින් කරනු ලබන වරදවල්.

**92.** (1) මේ පනතේ මේ කොටස යටතේ වූ වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරන ලද අවස්ථාවක—

(අ) ඒ මණ්ඩලය, සංස්ථාවක් නම්, ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂ වරයකුම, ඒ වරදට වරදකරුවකු විය යුතු ලෙස සලකනු ලැබිය යුතු ය ; තවද

(ආ) ඒ මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් නම්, ඒ ව්‍යාපාර ආයත නයේ සෑම හවුල්කරුවකු ම ඒ වරදට වරදකරුවකු ලෙස සලකනු ලැබිය යුතුය :

එසේ වුවද, ඒ අධ්‍යක්ෂවරයා හෝ හවුල්කරු විසින් ; ඒ වරද සිදු කරන ලද්දේ තමාගේ අනුදැනුමක් නොමැතිව බව හෝ ඒ වරද සිදු කිරීම වැලැක්වීම පිණිස තමා විසින් නිසි සියලු උද්‍යෝග යෙන් කටයුතු කළ බව ඔප්පු කළහොත්, මේ පනතේ මේ කොටස යටතේ වූ වරදකට ඒ අධ්‍යක්ෂවරයා හෝ හවුල්කරු වරදකරුවකු වේ යයි සලකනු නොලැබිය යුතුය.

රීති.

**93.** රීති සෑදීමට නියම කරනු ලැබ ඇති හෝ බලය දෙනු ලැබ ඇති සියලු කරුණු වෙනුවෙන් අධිකාරිය විසින් රීති සාදනු ලැබිය හැකි ය. එවැනි රීතියක්, අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන තෙක් ක්‍රියාත්මක නොවිය යුතු ය.

නියෝග.

**94.** (1) මේ පනතින් නියෝග සෑදීමට බලය දී ඇති කරුණු වෙනුවෙන් අමාත්‍යවරයා විසින් රීති සාදනු ලැබිය හැකි ය.

(2) විශේෂයෙන් ම සහ (1) වන උපවගන්තියෙන් පවරා දෙන ලද බලතලවල ව්‍යාප්තියට අගතියක් නොවන පරිදි, පහත දැක්වෙන කරුණුවලින් යම් කරුණක් වෙනුවෙන් හෝ ඒ සියල්ලම වෙනුවෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය :—

(අ) පුහුණුව සලස්වන තැනැත්තන්ගේ කාර්මික හා පුද්ගලික සුදුසුකම් ;

(ආ) පුහුණුව සලස්වාලන තැනැත්තන්ගේ සුදුසුකම් සම්බන්ධයෙන් දිය හැකි නිදහස් කිරීම් ; සහ

(ඇ) පුහුණුවීමේ ස්ථානවල යෝග්‍යතාවය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළකරනු ලබන දිනයේ දී හෝ නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි වෙනත් එවැනි පසු දිනයක දී ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු හැකි ඉක්මණින් ම අනුමතිය සඳහා පාර්ලිමේන්තුව හමුවට පැමිණ විය යුතුය. එසේ අනුමත කිරීමට නොයෙදුනු යම් නියෝගයක් ඒ අනනුමත දිනයේ සිට පරිච්ඡින්න කරනු ලැබූ සේ සැලකිය යුතු ය ; එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට එයින් හානියක් සිදු නොවිය යුතු ය.

ඉවත් කිරීම හා ඉඩ හැරීම්.

**95.** (1) 1971 අංක 49 දරන ජාතික ආධුනිකත්ව මණ්ඩල පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) ඉහත කී පනත ඉවත් කරනු ලැබුවේ වී නමුත්—

(අ) ජාතික ආධුනිකත්ව මණ්ඩලයේ සියලු චංචල හා නිශ්චල දේපළ ද, සියලු වත්කම් හා බැරකම් ද එය විසින් ඇතුළත් වී ඇති සියලු ගිවිසුම් ද අධිකාරිය වෙත පවරනු ලැබිය යුතු ය ;

(ආ) මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී ජාතික ආධුනිකත්ව මණ්ඩලයේ සිටි සියලු නිලධරයන් හා සේවකයන්, එවැනි නිලධරයන් හා සේවකයන් අධිකාරියේ සේවකයන් වීමට කැමති වූ අවස්ථාවක, මේ පනත ආරම්භ වන දිනයේ සිට අධිකාරියේ නිලධරයන් හා සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

(ඇ) 1971 අංක 49 දරන ජාතික ආධුනිකත්ව පනතේ විධිවිධාන යටතේ ඇතුළත් වී ඇති සියලු ආධුනිකත්ව ගිවිසුම් මේ පනතේ විධිවිධාන යටතේ ඇතුළත් වූ ගිවිසුම් ලෙස සලකනු ලැබිය යුතු ය ; තව ද

(ඈ) මේ පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද ජාතික ආධුනිකත්ව මණ්ඩලය විසින් සාදනු ලද සියලු රීති, පුහුණු වීමේ සම්මතයන්, මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයේ සිට අවුරුදු දෙකක කාලයකට නොවැඩි කාලසීමාවක් සඳහා වලංගුව තිබිය යුතු ය ; එසේ වුව ද, අධිකාරිය විසින් ඒ රීති හෝ පුහුණුවීමේ සම්මතයන් කවර හෝ අවස්ථාවක සංශෝධනය කිරීම, සුළු වශයෙන් වෙනස් කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම කරනු ලැබිය හැකි ය.

සංවර්ධන සැලැස්මක් නොතිබුනේ වුවද අවුරුදු දෙකක කාලසීමාවක් සඳහා අධිකාරිය විසින් බලතල ක්‍රියාත්මක කළ හැකි බව.

**96.** (1) අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව, අධිකාරිය විසින් මේ පනත ක්‍රියාත්මක වීමේ සිට අවුරුදු දෙකක කාලසීමාවක් සඳහා ආධුනිකත්ව ගිවිසුම්වලට ඇතුළත් විය හැකි අතර, 1971 අංක 49 දරන ජාතික ආධුනිකත්ව පනතේ විධිවිධාන එකී පනත ඉවත් කරනු නොලැබූ සේ එකී ගිවිසුම්වලට අදාළ විය යුතු ය.

(2) යම් සංවර්ධන සැලැස්මක් නොමැති විටක දී, අමාත්‍යවරයා විසින් මේ පනත ආරම්භ වී අවුරුදු දෙකක කාලසීමාවකට නොවැඩි කාලයක් සඳහා, යම්කිසි බලතල, කර්තව්‍ය හෝ කාර්ය ක්‍රියාත්මක කිරීමට අධිකාරියට බලය දෙනු ලැබිය හැකි ය.

(3) ජාතික ආධුනිකත්ව මණ්ඩලයෙන් අධිකාරියට කර්තව්‍යයන් පවරා දීම පහසු කිරීම් වස් සහ ඉදිරියේ දී ඇතිවිය හැකි අපහසුකම් සඳහා විධිවිධාන සැලැස්වීම් වස්, අමාත්‍යවරයා විසින්, අන්තර් කාලීන නියමයන් කරනු ලැබිය හැකි ය. එවැනි නියමයන් මේ පනත ආරම්භ වී අවුරුදු දෙකකට වැඩි නොවන කාලයක් සඳහා බලාත්මකව තිබිය යුතු ය. ඒ අන්තර් කාලීන නියමයන්, මේ පනතේ විධිවිධානවල ඊට පටහැනිව කිසිවක් සඳහන්ව තිබුණ ද බලාත්මකව තිබිය යුතු ය.

අර්ථ නිරූපණය.

**97.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා—

"සේවායෝජකයා" යන්නෙන්, පාරිශ්‍රමිකයක් සඳහා යම් ආයතනයක වැඩ කිරීමට වෙනත් යම් තැනැත්තකු සේවයෙහි නියුක්ත කරන අයෙක් අදහස් වන අතර, එවැනි ආයතනයක සේවා නියුක්තයින් අධීක්ෂණය කරන හෝ පාලනය කරන යම් තැනැත්තකු ද ඊට ඇතුළත් වේ ;

"ආයතනය" යන්නෙන්, යම් කර්මාන්තයක්, වෙළඳාමක්, ව්‍යාපාරයක් හෝ වෘත්තියක් කරගෙන යන යම් ස්ථානයක් අදහස් වේ ;

"නියමිත වෘත්තිය" යන්නෙන් ඒ වෘත්තියට ඇතුල්වීමට පෙරාතුව සාමාජිකයන්ගේ වෘත්තිය පුහුණුව සඳහා නීතියෙන් විධිවිධාන ඇති කර නොමැති වූ ද ඒ වෘත්තියේ

පාලන මණ්ඩලයක් වේ නම් ඒ පාලන මණ්ඩලයේ කැමැත්ත ඇතිව, පනතේ මේ කොටස යටතේ වෘත්තීය පුහුණුව පිළිබඳ විධිවිධාන සඳහා අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන වෘත්තියක් අදහස් වේ;

"පුහුණුවන්නා" යන්නෙන් පනතේ මේ කොටසේ විධිවිධාන යටතේ පුහුණුවීමේ පාඨමාලාවක් හදාරන යම් තැනැත්තකු අදහස් වන අතර ආධුනිකයකු ද ඇතුළත් වන්නේය;

"වෘත්තීය පුහුණුව" යන්නෙන් මූලික පුහුණුව, වැඩිදුර පුහුණුව සහ නැවත පුහුණුව අදහස් වේ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 177 කි. (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.